# ශ්‍රී පුර

සාඩම්බර අගනගරයක ජනතා ආමන්ත්‍රණය

2023 දෙසැම්බර් / 2024 ජනවාරි
පළමුවැනි කාණ්ඩය - 2 වැනි කාලාපය

**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ
මාසික විද්‍යුත් ප්‍රකාශනය**



## කවරයේ කතාව

19,20 පිටු







කවරයේ ඡායාරූප - ප්‍රදීප් අනුරුද්ධ

# කතුවැකිය

## ඔබගේ අදහස් අත්‍යවශ්‍යයි



කෝට්ටේ පුරවැසි ඔබ සැමගේ යහපත හා සුවසෙත උදෙසා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව මගින් පළකෙරෙන, මහා නගර සභා මාධ්‍ය ඒකකයේ නිර්මාණාත්මක කාර්යයක් වන 'ශ්‍රී පුර' මාසික විද්‍යුත් සඟරාවේ දෙවැනි කලාපය ඔබ වෙතට තිළිණ කරනුයේ හද පිරි අපමණ සතුටිනි, අභිමානයෙනි.

'ශ්‍රී පුර' මංගල කලාපය කියවූ ඔබ පළ කළ ප්‍රතිචාරයන් වඩාත් රසවත් වූත් හරවත් වූත් ප්‍රකාශනයක් ඔබ වෙත පමුණුවාලීමට අප ගන්නා උත්සාහය වඩ වඩාත් සාර්ථක කරගනු වස් ඉමහත් සවියක්, දිරියක්, ජවයක් විය.

'ශ්‍රී පුර' යනු හුදෙක් කෝට්ටේ මහා නගර සභාවේ ප්‍රචාරක මාධ්‍යයක් පමණක් ම නොවන බව අපි මංගල කලාපයේ කතුවැකියෙන් කියා සිටියෙමු. මෙය පුරවැසි ඔබ වෙනුවෙන් අප සකසන ඔබගේ ම සඟරාවකි. එබැවින් ඔබ ප්‍රදේශයේ අඩුපාඩු, ඔබ ව්‍යවසායකයකු නම් ඔබගේ ව්‍යාපාරයන් දියුණු කරගත හැකි මං කෙරෙහි අවධානය යොමු කිරීම, ව්‍යවසායකයකු වශයෙන් ඔබට ඇති වන ගැටලු සාකච්ඡා කිරීමට 'ශ්‍රී පුර' වේදිකාවක් කරගැනීම මෙම මාසික ප්‍රකාශනය එළිදැක්වීමෙහිලා මහා නගර සභාවේ එක් අරමුණකි.

එබැවින් මෙම කාර්යයේදී කෝට්ටේ පුරවැසි ඔබ අපත් සමගින් වඩාත් ළෙංගතු සබඳතාවක් පවත්වාගෙන යමින් ඔබගේ යහපත වෙනුවෙන් අප ගන්නා මෙම උත්සාහයේ සරු අස්වනු නෙළාගනු වස් ඔබගේ අදහස් උදහස් පමණක් නොව සාධාරණ වූ චෝදනාවන් ද අප වෙත ඉදිරිපත් කරමින් අප හා ඒකාත්මික වන මෙන් ගෞරවණීය වූ සිතුවිල්ලෙන් ඇරියුම් කරන්නෙමු.

**මාධ්‍ය ඒකකය**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව**
**රාජගිරිය**


උපදේශකත්වය

**ආර්. ඒ. ශාලිකා එස්. රණවීර මහත්මිය**
(නාගරික කොමසාරිස්)

**එච්. එම්. දයාරත්න මහතා**
(නාගරික ලේකම්)

සංස්කරණය
**නළුන් අමන්ද මනමේන්ද්‍ර ආරච්චි**

පිටු සැලසුම්කරණය
**රංජිත් පුෂ්පකුමාර**
**ප්‍රදීප් අනුරුද්ධ පෙරේරා**

ඡායාරූප
**සමීර සඳුන් කුමාර**
**ප්‍රදීප් අනුරුද්ධ පෙරේරා**

විශේෂාංග ලේඛකයන්
**තිළිණ සම්පත්**
**සුනෙත් ජයකොඩි**
**අනුර යහම්පත්**
**නිර්මාණී කොඩිකාර**




## ශ්‍රී පුර මංගල කලාපය නිකුත් වූ දා...

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ මාධ්‍ය ඒකකයේ නිර්මාණාත්මක කාර්යයක් ලෙසින් පළකෙරෙන 'ශ්‍රී පුර' මාසික විද්‍යුත් සඟරාවේ මංගල කලාපය 2023 නොවැම්බර් 15 වැනි දින මහා නගර සභා පරිශ්‍රයේදී අන්තර්ජාලයට මුදාහැරිණි.

කොළඹ දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී, කෝට්ටේ සම්බන්ධීකරණ කමිටුවේ සභාපති නීතිඥ මධුර විතානගේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදුවූ මේ කටයුත්ත වෙනුවෙන් නාගරික කොමසාරිස් ආර්. ඒ. ශාලිකා එස්. රණවීර මහත්මිය ප්‍රධාන මහා නගර සභා දෙපාර්තමේන්තු ප්‍රධානීහු සහභාගී වූහ.

**www.kotte.mc.gov.lk/images/sri_pura/file_per_2.pdf** යන වෙබ් ලිපිනය ඔස්සේ 'ශ්‍රී පුර' සඟරාව ඔබට කියවීමේ හැකියාව ඇත.






# චීන සෙන්පතියාට හිරිහැර කළ
# අලකේශ්වරට බිහිසුණු දඬුවමක්

**2 වැනි දිගහැරුම**

**ශ්‍රී ලාංකේය ඉතිහාස කතා පුවත තුළ කෝට්ටේ රාජධානි සමය කරුණු කාරණා කිහිපයක් නිසා ගෞරවණීයත්වයට පත්ව තිබේ. පරසතුරු උවදුරු මුලුමනින්ම දුරු කොට ලක්දේශය එක්සේසත් කිරීම, සිංහල සාහිත්‍ය නිර්මාණකරණය කෙරෙහි රාජ්‍ය අනුග්‍රහය උපරිමව ලැබී සිංහල සාහිත්‍යයෙහි ස්වර්ණමය යුගය බවට කෝට්ටේ යුගය පත්වීම ඒ අතර මූලික වේ. එලෙසම ලක් ඉතිහාසයෙහි අඳුරු කාලපරිච්ඡේදයන් කිහිපයක් ද කෝට්ටේ ඉතිහාසය තුළ සනිටුහන් වී ඇත. පෘතුගීසි පාලන සමයෙහිදී ධර්මපාල රජු විසින් කෝට්ටේ රාජධානිය තෑගි ඔප්පුවක් මගින් පෘතුගාලයට පැවරීම ඒ අතරින් ප්‍රමුඛ වේ. මේ සිදුවීම් කාලානුරූපව පෙළගස්වමින් කෝට්ටේ ඉතිහාසය කියා දෙන ලිපි පෙළක තවත් පියවරකි මේ.**

ගම්පොළ රාජධානියේ 3 වැනි වික්‍රමබාහු රජුගේ අභාවයෙන් අනතුරුව රාජ්‍යත්වයට පත්වූයේ නිශ්ශංක අලගක්කෝනාරට දාව මේ රජුගේ සොහොයුරිය බිහි කළ පුතු ය. හෙතෙම 5 වැනි බුවනෙකබාහු නමින් රජ විය.



මෙයට මඳ කලකට පසුව එනම් ක්‍රි. ව. 1381 දී පමණ නිශ්ශංක අලගක්කෝනාර අතින් අන්ත පරාජයක් ලබා සිටි යාපනයේ ආර්යචක්‍රවර්තී කෝට්ටේට හා ගම්පොළට එක වර පහර දුන්නේය. ඒ, ගොඩබිමෙන් හා මුහුදෙන් විශාල හමුදාවන් දෙකක් මෙහෙයවමිනි.

මේ තත්ත්වය හමුවේ ගම්පොළ සිටි 5 වැනි බුවනෙකබාහු රජු කෝට්ටේ වෙත පළා ගියේය. උඩරට සේනාවෝ ආර්යචක්‍රවර්තීගේ සේනාවන් පළවා හැරියෝය.

මුහුදෙන් පැමිණි හමුදාව දෙමටගොඩ හා පානදුරේ යනාදී ප්‍රදේශවල කඳවුරු බැඳ ගත්හ. අලගක්කෝනාරගේ හමුදාවෝ ඔවුන්ගේ නැව් විනාශ කොට ඔවුන් පළවා හැරියේය. තත්ත්වය සන්සිඳුණෙන් 5 වැනි බුවනෙකබාහු රජු නැවතත් ගම්පොළ රාජධානියට ගියේය.

5 වැනි බුවනෙකබාහු රජුගේ පාලන සමයේ අවසාන කාලයේදී ඈපා තනතුර දැරුවේ අර්ථනායක නමැත්තෙකි. ඔහුගේ අභාවයෙන් පසුව ඒ තනතුර හිමි වූයේ දේවමන්ත්‍රී නමැත්තකුටය. මොහු නිශ්ශංක අලගක්කෝනාරගේ සොයුරෙකි. මේ රජු අවසාන කාලයේදී කෝට්ටේ බලා ගිය පසුව රාජ සභාවේ උසස් නිලධාරීහු එක්ව දේවමන්ත්‍රී නමැත්තා 2 වැනි වීරබාහු නමින් ගම්පොළ රජ කරවීය.

මෙකල වීර අලකේශ්වර ඉහත රජුගේ පාලනය පිළිනොගෙන රයිගම සිට රටේ පහතරට ප්‍රදේශ පාලනය කළේය. ගම්පොළ රජුගේ සේනාවෝ ඔහු ඇල්ලීමට කෝට්ටේ බලා ගියහ. මේ සටනින් පරාජය ලද අලගක්කෝනාර දඹදිවට පළාගියේය.

මේ කාලය වන විට චීනය පාලනය කළේ ඉයුං ලෝ නම් අධිරාජයාය. මෙකල එනම් ක්‍රි. ව. 1405 දී චිං හෝ නම් සේනාධිපතියෙක් සුවඳ විලවුන්, පූජා ද්‍රව්‍ය යනාදිය රැගෙන ලක්දිවට පැමිණියේය.

වීර අලකේශ්වර මොහු වෙත දැක්වූයේ මිතුරු ආකල්පයක් නොවීය. ලක්දිව දකුණු දෙසට යාත්‍රා කළ ඔහු දෙවුන්දර උපුල්වන් දේවාලය වැඳ පුදාගෙන එහි දෙමළ, චීන හා පර්සියන් භාෂාවලින් සෙල් ලිපියක් පිහිටුවීය



4 පිටුවට

(ගාල්ලේ ත්‍රිභාෂා සෙල් ලිපිය ලෙස පතළ වී ඇත්තේ මෙය යැයි පිළිගැනීමකි).

චිං හෝ නැවතත් විශාල නැව් හමුදාවක් සමගින් ලක්දිවට පැමිණියේය. එවරද වීර අලකේශ්වර ඔහු වෙත දැක්වූයේ හිතවත් බවක් නම් නොවේ. ඔහු ගස් කොළං කපා හෙළා ඉයුං ලෝ එන මග අවහිර කළේය, ඔහුගේ නැව් විනාශ කිරීමටද කටයුතු යෙදුවේය.

චිං හෝ සමග කෙරුණු සටන්වලින් පරාජය ලද වීර අලකේශ්වර හා සිංහල සේනාව සිරකරුවන් ලෙසින් චීනයට රැගෙන යන ලදුව චීන රාජ සභාව හමුවට පැමිණවීය. ඔවුන්ට මරණ දඬුවම නියම විය. නමුත් ඔවුන්ට සමාව දුන් චීන අධිරාජයා මේ පිරිස නැවතත් ලක්දිවට පිටත් කර හැරියේය.

**නදුන් අමන්ද මනමේන්ද්‍ර ආරච්චි**

# ඇතුල්කෝට්ටේ අලකේශ්වර සොහොන






පිටකෝට්ටේ මංසන්ධියේ සිට රාජගිරිය දක්වා දිවෙන ප්‍රධාන මාර්ගයේ පිහිටි අලකේශ්වර මාවතෙන් වමට හැරී මීටර් 200 ක් පමණ ගමන් ගත් විට මේ ස්ථානයට ළඟා විය හැකි ය.

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් පුරාවිද්‍යාත්මක ස්මාරකයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති මේ ස්ථානය පිළිබඳ මත 2 ක් ඇත. එකකින් කියවෙන්නේ මෙය කෝට්ටේ බලකොටුවක් තනවා රාජධානියක් බවට පත් කළ නිශ්ශංක අලගක්කෝනාර හෙවත් නිශ්ශංක අලකේශ්වරගේ සොහොන බව ය.

ගම්පොළ රාජධානියට පසුව කෝට්ටේ රටේ අගනුවර බවට පත්වීමේ මූලික පදනම සැකසුණේ නිශ්ශංක අලකේශ්වර විසින් එහි බලකොටුවක් ඉදිකරනු ලැබීම හේතුවෙනි. මෙම බලකොටුව ඉදිකිරීමට හේතු වූයේ ඒ වන විට යාපනය අර්ධද්වීපයේ බලය පතුරුවාගෙන සිටි ආර්යචක්‍රවර්තී ලක්දිව බටහිර තොටුපොළ කේන්ද්‍ර කරගනිමින් සරු ආදායම් උපයාගැනීම වළක්වා අලකේශ්වරයන් එහි වෙළෙඳ බලය සියතට ගැනීම ය.

ඔහු මෙම බලකොටුව කේන්ද්‍රස්ථානය බවට පමුණුවා ගනිමින් ඒ වන විට හලාවත, මීගමුව, වත්තල, කොළඹ යන තොටුපොළවල ආදායම් රැස් කරගනිමින් සිටි ආර්යචක්‍රවර්තීගේ බල සේනාවන්ට පහර දී පළවා හැරියේය. පසු කලක කෝට්ටේ රාජධානිය පිහිටුවීමේදී මෙම බලකොටුව බෙහෙවින්ම උපකාර විය.

බලහත්කාරයෙන් කෝට්ටේ අගනගරය අල්ලාගැනීමට තැත් කළේ යැයි පසු කලක චෝදනා ලබා ඝාතනයට ලක් වූ අලකේශ්වර බහිරව පොකුණේ කිඹුලන්ට ආහාරයට දැමූ බව කියවේ. එබැවින් දේහය සොහොන් ගැබක තැන්පත් නොකළ බවට අනුමාන කෙරේ.

අනෙක් මතයෙන් කියවෙන්නේ මෙතැන අලකේශ්වරයන්ගේ මාලිගාව පිහිටා තිබූ බව ය. මෙහි නිරීක්ෂණය කළ හැකි වාස්තු විද්‍යාත්මක ඉදිකිරීම් සහ ඇඹරුම් ගල්, ජල පෙරණ වැනි උපකරණවලින් මේ මතය යම් තරමකට තහවුරු වේ.

මේ ස්ථානයේ එකිනෙකට ළංව පිහිටි ගොඩනැගිලි 2 ක පාදම් (අත්තිවාරම්) 2 කි. වඩා විශාල පාදමේ දිග හා පළල අඩි 41 ක් හා අඩි 18.5 කි. සමචතුරස්‍රාකාර වූ අනෙක් ඉදිකිරීමේ දිග අඩි 21.5 කි. උසින් අඩි 4 ක් පමණ වන මේ පාදම් කබොක් ගලින් නිමවා ඇත.


**නඳුන්**




## සිංහල වේදිකා නාට්‍ය කලාවේ උන්නතිය උදෙසා

## පුරෝගාමී මෙහෙවරක යෙදුණු

# නීතිඥ ජෝන් ද සිල්වා



ලංකාව තුළ දිගු කලක් පුරා පැවැති සමාජ ක්‍රමය හා සංස්කෘතිය පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි ජාතිකයින් මෙරටට පැමිණීමත් සමග විවිධාකාර වූ වෙනස්කම්වලට භාජනය විය. පෘතුගීසිහු රෝමානු කතෝලික ආගමත් ලන්දේසීහු රෙපරමාදු ආගමත් සිය පාලන ප්‍රදේශවල ව්‍යාප්ත කළහ. ක්‍රි. ව. 1815 දී සමස්ත ලක්දිවම බ්‍රිතාන්‍ය යටත්විජිතයක් බවට පත්විය. බ්‍රිතාන්‍ය පාලන යුගයේදී මෙරටට පැමිණි විවිධ මිෂනාරී සංවිධාන ක්‍රිස්තියානි ආගම පැතිරවීමට කටයුතු කළේය.

මේ හේතුවෙන් මෙරට පැවැති සාම්ප්‍රදායික ආගම්වල හා සංස්කෘතීන්වල පැවැත්මට අනේකවිධ බාධා එල්ල විය. මේ ව්‍යසනකාරී තත්ත්වයෙන් මිදීම සඳහා 19 වැනි සියවස අගභාගයේදී බෞද්ධ, හින්දු හා ඉස්ලාම් ආගම් අදහන්නන් තුළ ආගමික හා ජාතික වශයෙන් ඇති වූ පිබිදීම 'ශ්‍රී ලංකාවේ ආගමික හා සංස්කෘතික පුනර්ජීවනය' ලෙසින් හැඳින්වේ.

මෙකී පුනර්ජීවනයේ එක් පියවරක් වූයේ දේශීය සංස්කෘතිය ආරක්ෂා කිරීමට කටයුතු කිරීම ය. ඒ කාර්යයේ නිරත වූවන් අතර කැපී පෙනෙන චරිතයක් වූයේ නීතිඥ ජෝන් ද සිල්වා ය. ඓතිහාසික හා බෞද්ධ ප්‍රවෘත්තීන් ඇතුළත් වේදිකා නාට්‍ය රචනා කර රඟදැක්වූ හෙතෙම මෙරට වේදිකා නාට්‍ය කලාවේ පුරෝගාමියකු විය.

හෙතෙම 1857 ජනවාරි 13 වැනි දින ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, මාකලන්දේ, තෙළෙඹුගහවත්තේදී උපත ලැබී ය. මාකලන්දගේ දොන් බැස්ටියන් ද සිල්වා හා දොන් මනුවෙල්ගේ දෝන ඉසබෙලා මවුපියෝ වූහ.

මූලික සිංහල අධ්‍යාපනයක් ලද ඔහු කෝට්ටේ චර්ච් මිෂන් සමාගමේ එංගලන්ත සභා පාඨශාලාවෙන් (වර්තමානයේ කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර මහා විද්‍යාලය) ඉංග්‍රීසි අධ්‍යාපය ලැබී ය. හත්වැනි ශ්‍රේණියේ සිට ඉගෙනුම ලැබුවේ කොළඹ ඇකඩමියෙනි (වර්තමානයේ කොළඹ රාජකීය විද්‍යාලය). මේ විදුහලේදී ඔහුට ඉංග්‍රීසි භාෂාව හා ඉංග්‍රීසි සාහිත්‍යය පිළිබඳ පුළුල් දැනුමක් ලැබුමට හැකි විය. සිංහල ව්‍යාකරණ හා සිංහල සාහිත්‍යය, පාලි හා සංස්කෘත භාෂාවන් ඉගෙන ගත්තේ පණ්ඩිත හෙන්රි පෙරේරාගෙන් හා බටුවන්තුඩාවේ ශ්‍රී දේවරක්ෂිත පඬිවරයාගෙනි.

හෙතෙම වෘත්තීය ජීවිතයට අවතීර්ණ වූයේ ගුරුවරයකු වශයෙනි. ඒ අනුව පේරාදෙණිය හා ගම්පොළ පළාත්වල පිහිටි ඉංග්‍රීසි මාධ්‍ය විදුහල්වලද අනතුරුව කොළඹ සාන්ත ජෝසප් හා වෙස්ලි විදුහල්වලද ඉංග්‍රීසි බස ඉගැන්වී ය.

නාට්‍ය, ගීත, කවි වැනි සාහිත්‍යාංග කෙරෙහි දැඩි නැඹුරුවක් දැක්වූ හේ කාව්‍ය රචනය විනෝදාංශයක් කොට ගත්තෙකි. ඔහුගේ මුල්ම ප්‍රසිද්ධ කාව්‍ය ප්‍රබන්ධය ලෙස සැලකෙනුයේ 'ඉංග්‍රීසි වෙස් ගත් සිංහල තරුණියක් වූ සැරපිනාගේ කතාව' ය. සමාජ උපහාසාත්මක නිර්මාණයක් වූ මෙය ඉතාමත් ජනප්‍රිය විය. මේ වන විට



6 පිටුවට




ලේඛකයකු ලෙසින් හෙතෙම බෙහෙවින් කීර්තියක් හිමි කරගෙන සිටියේය. එබැවින් ගුරු වෘත්තියෙන් සමුගෙන පූර්ණකාලීන ලේඛනයට පිවිසියේය.

අද මෙන් විද්‍යුත්, මුද්‍රිත මාධ්‍යයන් සුලබ නොවූ එකල 'කවි කොළය' ප්‍රබල ප්‍රචාරාත්මක මාධ්‍යයක් විය. ලංකාවේ මුල්ම කවි කොළයේ නිර්මාතෘවරයා වූයේ ඔහු ය.

හේ වඩාත් සුපතළ වූයේ වේදිකා නාට්‍ය ශිල්පියකු ලෙසිනි. 1887 දී නිර්මාණය කළ සිය ප්‍රථම වේදිකා නාට්‍යය 'රාමායණය' විය. එකල වේදිකා නාට්‍ය බොහෝ දෙනකුට නොහුරු අත්දැකීමක් විය. තවද මේ නාට්‍යය ප්‍රදර්ශනය කිරීම නිර්දය ලෙස විවේචනය කළ පිරිසක් ද විය. මේ නාට්‍යය මුල් වරට වේදිකාගත කළ මොහොතේ මෙකී කණ්ඩායම ඒ ශාලාවට ගිනි තැබී ය. ඉන් පසුව එය 'ගිනි ගත් රාමායණය' ලෙසින් පතළ විය.

මේ වනවිට ආර්ථික මට්ටමෙන් ඉතාමත් පහත් අඩියක පසු වූ ජෝන් ද සිල්වා හට නීතිඥයකු වන්නැ'යි මිතුරකුගෙන් උපදෙසක් ලැබුණේය. නීති විභාගය ඉහළින්ම සමත් වන හේ එතැන් පටන් නීතිඥ ජෝන් ද සිල්වා ලෙසින් සුපතළ විය.

මේ කවර වෘත්තියක නියැළුණ ද ඔහු වේදිකා නාට්‍යකරණය කිසිසේත් අත්නොහළේය. හේ වේදිකා නාට්‍ය ඇතුළු නිර්මාණ 54 ක් බිහිකළේය. 'සිරිසඟබෝ', 'දුටුගැමුණු', 'ශ්‍රී වික්‍රම' ඔහු නිර්මාණය කළ වේදිකා නාට්‍ය රැසෙන් අතළොස්සකි. පිළිවෙළින් මේවායේ එන 'දන්නෝ බුදුන්ගේ ශ්‍රී ධර්මස්කන්ධා', සුවඳ පත්ම ඕළු ආදි', 'දන්න වං හුං අප කන්නසාමි' ඒ නූර්තිවල එන එදත් අදත් හෙටත් එක ලෙසින් ජනප්‍රියත්වය නොසිඳෙන ගීතයන් ය.

මේ අතරින් 'දන්නෝ බුදුන්ගේ ශ්‍රී ධර්මස්කන්ධා' ගීතය පසුගියදා ශ්‍රී ලංකා රජය විසින් ජාතික උරුමයක් බවට ප්‍රකාශයට පත්කෙරිණි.

1915 දී මුස්ලිම්වරුන්ට එරෙහිව මහනුවරින් ඇරඹි අරගලය ඉතා කෙටි කලකින් රට පුරාම පැතිරිණි. මෙයට මුල්වූවන් ලෙසින් පදනම් විරහිත චෝදනා එල්ල කරමින් අපගේ ජන නායකයින් රැසක් සිරභාරයට ගැනිණි. ඒ අතර නීතිඥ ජෝන් ද සිල්වා ද විය. ඉන් නිදහස්ව පැමිණි හෙතෙම දිවියේ අවසන් මොහොත වන තෙක්ම



**ජාතික කලාභවනට පිටුපසින් පිහිටි ජෝන් ද සිල්වා සමරු රඟහල**

වේදිකා නාට්‍යකරණයේ යෙදුණේය. 1922 ජනවාරි 22 වැනි දින හෙතෙම දිවි රඟමඬලෙන් සමුගත්තේය.

මේ කීර්තිමත් කලාකරුවාට ගෞරව කෙරෙමින් 1974 දී සංස්කෘතික අමාත්‍යාංශය කොළඹ ඉදිකරවූ නාට්‍ය ශාලාව 'ජෝන් ද සිල්වා සමරු රඟහල' ලෙසින් නම් කෙරිණි.

## නළුන්

දන්නෝ බුදුන්ගේ ශ්‍රී ධර්මස්කන්ධා
පේ වී රකිති සොඳ සීලේ නිබන්ධා//

ක්ලේශ නස්නා භික්ෂු ඇත්තේය බොහෝ සේ//
රහතුන් නිවසනා පායා ප්‍රකාශේ//

හුලෝ මතේ මේ දෙව්ලෝ පෑවා සේ
පේනා මෙපුර මුණි සාසන වාසේ//

ඉර්දියෙන් යන්නා වූ නෙක් රහතුන්ගේ//
සෙවනැල්ලෙනි හිරු රශ්මිය භංගේ//

මානෙල් නෙළුම් හා ඕළු පුෂ්පාදී
ඇත්තේ පොකුණුවල බෝ ජල පෑදී//
සේරු පන්තී පන්තී පීනති බෝ සේ//
අනුරාධ නගරේ දැන් පෙනේ තෝසේ//

ගේය පද රචනය : නීතිඥ ජෝන් ද සිල්වා    මුල් සංගීතය : විශ්වනාත් ලව්ජී

# සැබෑ නත්තල කුමක්ද?



රාජගිරිය සිරි හද දේවස්ථානය

විශේෂ නත්තල් ලිපිය

වසරක් පාසා උදාවන නත්තල අප සැමටම සාමය, සතුට උරුම කරවන උත්සවයකි. මෙහි ආරම්භය වසර 2000 ට පෙර බෙත්ලෙහෙමේ උපත ලද ජේසු සමිඳුන්ගේ උපත ය. දෙවියන් වහන්සේ ලෝකයට කොතරම් ප්‍රේම කළා ද කිවහොත් එතුමන්ගේ එකම පුත්‍රයාණන් මිනිසත්බවට පමුණුවා අපගේ ලෝකයට එවීමට තරම් උන්වහන්සේ අපට ප්‍රේම කළ සේක.

සාමයේ කුමාරයාණන් ලෙස මෙලොව ඉපිද දෙවියන් වහන්සේගේ ආදරය, කරුණාව, සමාව පිළිබඳ දේශනා කොට ඒ අනුව ජීවත් වී අවසානයේදී ඒ වෙනුවෙන් ජීවිතය පූජා කරමින් උන්වහන්සේ ලෝකයට සාමයේ පණිවිඩය රැගෙන ආවේය.



නත්තල උදාවත්ම දසත පැතිරී යන සතුට අද සමාජය තුළ හුදෙක් වෙළෙඳ ප්‍රචාරයකට පමණක් සීමා වී ඇති බව පෙනේ. කා බී විනෝද වී සමරන උත්සවයක් බවට නත්තල සීමා වී ඇත. ලෝකය දෙස බලන විට සාමය තවමත් උදා වී නැති බව අපට හැඟී යන්නේය. ජාතික වශයෙන් මෙන්ම අන්තර්ජාතික වශයෙන් ද මිනිසුන් අතර ද ජන වර්ගයන් අතර ද ඇති වන්නා වූ කලකෝලාහල ජන ඝාතන බවට පත්වන අවස්ථාවන් අපි දනිමු. මෙවන් පසුබිමක් තුළ සැබෑ සාමය යනු කුමක්දැයි, එය පවතින්නේ කොතැනදැයි යන්න අපට ඉමහත් ගැටලුවකි.

ක්‍රිස්තුන් වහන්සේ අපට ඉගැන්වූ සාමයේ පණිවිඩය මිනිසුන් තවම තේරුම් ගෙන නැති බව පෙනේ. නත්තලේ සැබෑ ප්‍රීතිය හුදෙක් විනෝද සාදයකට පමණක් සීමා කළ නොහැකි ය. එය එක් දවසකට ද සීමා කළ නොහැකි ය. ජේසු සමිඳුන් දේශනා කරන සාමය සදාකාලික සාමයකි.

උන්වහන්සේගේ සාමයේ පණිවිඩය ජාති ආගම් සීමාවන් ඉවත් කළ එකකි. එවන් සාමයක් සැබෑ ලෙසින් උදාවන්නේ මිනිසුන්ගේ හදවත් තුළ සාමය ස්ථාපිත වුවහොත් පමණි. ලොව සෑම ගැටුමකටම මූලික වන්නේ මිනිස් හදවතේ ඇති වන ගැටුම් ය. මිනිසාගේ හෘද සාක්ෂියට එකඟව කටයුතු නොකරන අවස්ථාවන්හිදී අප හදවත් තුළ ගැටුම්කාරී තත්ත්වයන් උදා වේ.

සැබෑ සාමයක් අත්දකින්නට නම් අප සිතට එකඟව කටයුතු කරන ධර්මිෂ්ඨ, අවංක පුද්ගලයන් බවට පත්විය යුතුය. අනෙකා ගැන සිතන, අසල්වැසියන් වෙනුවෙන් කැප වන ජීවන පිළිවෙතකට අප හුරු විය යුතුය. තරගකාරී සමාජ ක්‍රමය ප්‍රතික්ෂේප කළ යුතුය. අන් අයගේ නිදහස වෙනුවෙන් කැප විය යුතුය. නීතිගරුක පුද්ගලයන් ලෙසින් සෑම කෙනෙකුටම ජීවත්වීමේ අයිතිය තහවුරු කර දීම මිනිසාගේ පරම වගකීමකි, යුතුකමකි.

සෑම ආගමකින්ම ප්‍රකාශ වන ගුණධර්ම, වටිනාකම් අනුව ජීවත්වන විට අපි වඩාත් සන්සුන් හා සාමකාමී පුද්ගලයන් බවට පත්වන්නෙමු. එවන් පුද්ගලයන් ඇතුළාන්ත සාමය අත්විඳින පුද්ගලයන් බවට පත්වනු ඇත. එවන් පුද්ගලයන්ට සැමදා සැබෑ නත්තල් ය.

මිනිසත්බව ලැබගත් ක්‍රිස්තුන් වහන්සේ අපේක්ෂා කළේ එවන් නත්තලකි. උන්වහන්සේගේ සාමයේ පණිවිඩය අප හදවත් තුළ උපදින විට, අප සැමට නත්තලේ සැබෑ අරුත වැටහෙනු ඇත.

මේ උදා වූ නත්තල ඔබ සැමටම වඩාත් අර්ථවත් සාමකාමී නත්තලක් වනු ඇතැ'යි ප්‍රාර්ථනා කරමි.



**ගරු ජූඩ් නික්සන් පියතුමා**
**සිරි හද දේවස්ථානය**
**රාජගිරිය**

**විශේෂ තෛපොංගල් ලිපිය**

# තෛපොංගල් සෑම කෙනෙකුම කිසිම භේදයකින් තොරව සැමරිය යුතු උත්සවයක්



රාජගිරිය ශ්‍රී මහා වීර හද්‍රකාලී අම්මන් දේවස්ථානයේ ප්‍රධාන සෛව ආචාර්ය
වාස්තු සිද්දර් ස්වාමී කාලී කනගරත්තිනම් පදනමේ සභාපති
කනගරත්තිනම් මාරිශන් ආචාර්යතුමා

බොහෝ දෙනකුගේ අදහස නම් තෛපොංගල් උත්සවය ද්‍රවිඩ ජනතාවටත් හින්දු බැතිමතුනටත් පමණක් සීමා වූ උත්සවයක් ලෙසිනි. එය මුලුමනින්ම වැරදි අදහසකි. මුලු ලෝකයේම ජීවත්වන සියලුම දෙනා ජාති, ආගම්, කුල ආදී භේද වලින් තොරව සෑම දෙනාම එකමුතු වී මේ උත්සවය සැමරිය යුතුය.



මේ උත්සවයේ මූලික හරය සූර්ය දෙවිඳුන්ට කෙළෙහි ගුණ දැක්වීමයි. සූර්ය දෙවිඳුන්ගෙන් අප සෑම දෙනාටම ජාති, කුල, ආගම්, දුප්පත්, උගත්, නූගත් ආදී කිසිදු භේදයකින් තොරව තමන්ගේ ආලෝකය හා බලය ලබාදේ. සූර්ය දෙවිඳුන්ගෙන් තොරව ලෝකයේ පැවැත්මක් නැත. මෙය ගම්වැසි, රටවැසි, ලෝකවැසි සෑම දෙනාටම පොදු උත්සවයක් ලෙස මා සඳහන් කළේ ඒ හේතුව නිසාය.

සූර්ය දෙවිඳුන්ගේ ආලෝකය හා බලය වසර පුරාම එක ලෙසින්ම අප සැමට ලැබේ. ඒ නිසා අප සෑම දිනකම එතුමන්ට කෙළෙහි ගුණ දැක්විය යුතුය. නමුත් එය ප්‍රායෝගිකව කළ හැකි දෙයක් නොවන්නේය. ඒ හේතුවෙන් ජනවාරි මාසයේ මැද දිනයක් යොදාගැනේ. මේ වසරේ (2024) ජනවාරි 15 වැනි දිනට තෛපොංගල් උත්සවය යෙදිණි.

අපි මේ ආකාරයෙන් සූර්ය දිව්‍ය පූජාව කළ යුතු වන්නේ ධනාත්මක සිතුවිලි උපදවා ගනිමින්ය. ඒ ධනාත්මක සිතුවිල්ල ධනාත්මක ශක්ති ප්‍රභේදයක් ලෙස ක්‍රියාත්මක වී ස්වාභාවික අනතුරුවලින් ආරක්ෂාව ලැබී සූර්ය දෙවිඳුන්ගේ ආශිර්වාදය හා ආරක්ෂාව තුළින් අපගේ ජීවිතවලට වාසනාව සැලසෙන බව හින්දු පුරාණවල සඳහන් වේ.

සූර්ය දෙවිඳුන්ට සමාන වූ තවත් කොට්ඨාසයක් වන්නේ අපට ආහාරය නිපදවා දෙන ගොවි ජනතාවයි. ඔවුන් කිසිදු භේදයක් නොසලකා ගොවිතැන් කර අපගේ කුසගිනි නිවා දැමීමට දායක වන්නාක් මෙන් සූර්ය දෙවිඳුන්ද කිසිදු භේදයකින් තොරව තම ආලෝකය හා බලය ලොවටම ලබාදේ. එබැවින් තෛපොංගල් දිනය උතුම් ගොවි ජනතාව වෙනුවෙන්ද ගරු සරු කෙරෙන, කෙළෙහි ගුණ සලකන උත්සව දිනයක් ලෙස පිළිගැනේ.

එසේ නම් මෙම උතුම් තෛපොංගල් දිනයේ රවි දෙවිඳුන්ගේ ආලෝකය හා බලය ලැබී ඔබට සහ ඔබගේ පරම්පරාවට සතුටින් ජීවත්වන්නට වාසනාව උදාවේවා! කියා මම ප්‍රාර්ථනා කරමි.







# බැද්දගාන මහජන පුස්තකාලය

විශේෂ ස්තුතිය
බැද්දගාන මහජන පුස්තකාලයාධිපතිනි
මංජුලා ප්‍රියංගනී පීරිස් මහත්මියට

**ශ්‍රී ජයවධනපුර කෝට්ටේ මහා නගර සභාව යටතේ පාලනය වන මහජන පුස්තකාල හතරකි. බැද්දගාන මහජන පුස්තකාලය මේ අතරින් එකකි. පිටකෝට්ටේ - බැද්දගාන මාර්ගයට ආසන්නව මෙය පිහිටුවා ඇත.**

මුලින් ප්‍රජා ශාලාවක් ලෙසින් පරිහරණය කෙරුණු මේ ගොඩනැගිල්ල ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව විසින් මහජන පුස්තකාලයක් බවට පත්කර විවෘත කර ඇත්තේ 1992 ඔක්තෝබර් 30 වැනිදාය. ඒ, එවකට කෝට්ටේ කීර්තිමත් නගරාධිපතිවරයකු වූ නීතිඥ චන්ද්‍රා සිල්වා මැතිතුමාගේ මූලිකත්වයෙනි.

මෙම මහජන පුස්තකාලය ළමා අංශය, වැඩිහිටි අංශය, විමර්ශන අංශය, කියවීම් හා අධ්‍යයන අංශය යන අංශවලින් සමන්විත වේ.



ළමා අංශය ළමා ශාස්ත්‍රීය ග්‍රන්ථ, ළමා ඉංග්‍රීසි ප්‍රබන්ධ හා ළමා ඉංග්‍රීසි ශාස්ත්‍රීය ග්‍රන්ථ 10103 කින් සමන්විත ය.

වැඩිහිටි අංශය ප්‍රබන්ධ ග්‍රන්ථ, ශාස්ත්‍රීය ග්‍රන්ථ, ඉංග්‍රීසි ප්‍රබන්ධ ග්‍රන්ථ, ඉංග්‍රීසි ශාස්ත්‍රීය ග්‍රන්ථ හා දමිළ ග්‍රන්ථ යන කාණ්ඩ යටතේ ග්‍රන්ථ වර්ග කර ඇත. මේ කාණ්ඩවලට අයත් ග්‍රන්ථ 24,211 ක් වැඩිහිටි අංශය සතු වේ.

ළමා අංශය හා වැඩිහිටි අංශය පරිහරණය කිරීම සඳහා පුස්තකාල සාමාජිකත්වය ලබාගැනීම අනිවාර්යය වේ.

විමර්ශන අංශය සතුව ශාස්ත්‍රීය ලේඛන විමර්ශන මූලාශ්‍ර ආදිය ඇතුළත් ග්‍රන්ථ රැසක් තිබේ. අධ්‍යයන හා ශාස්ත්‍රීය ගවේෂණවල යෙදෙන අයට මේ අංශයෙන් ලැබෙන පිටිවහල අතිමහත් ය. විමර්ශන අංශය පරිහරණය කිරීම සඳහා පුස්තකාල සාමාජිකත්වය ලබා නොතිබීම අත්‍යවශ්‍ය නොවන්නේ ය.

කියවීම් හා අධ්‍යයන අංශය ද පුස්තකාල සාමාජිකයින් නොවන අයට වුවද පරිහරණය කළ හැකි ය. මෙහිදී භාෂා ත්‍රිත්වයටම අයත් දිනපතා හා ඉරිදා පුවත්පත් ද කාන්තා පුවත්පත් ද වාර සඟරා ද කියවීමේ පහසුකම් සලසා තිබේ.

අධ්‍යයන අංශය වෙන් වී ඇත්තේ අධ්‍යාපන කටයුතු සඳහා පුස්තකාලය වෙත පැමිණෙන පිරිස් වෙනුවෙනි. එහිදී ලැප්ටොප් පරිගණක, ජංගම දුරකතන ආදී අධ්‍යාපන කටයුතු සඳහා උවමනා වන විද්‍යුත් උපකරණ ආරෝපණය කරගැනීමේ පහසුකම් ද සලසා දී තිබේ.

මේ පුස්තකාලයට උරුම ලක්දිව ශ්‍රේෂ්ඨ කතුවරුන්ගේ කෘති එකතුව ද විශේෂයෙන් සිහිපත් කළ යුතුය. එය මාර්ටින් වික්‍රමසිංහ, කුමාරතුංග මුනිදාස, ටී. බී. ඉලංගරත්න හා ඩබ්ලිව් ඒ. සිල්වා යන ලේඛකයින්ගේ කෘතිවලින් සමන්විත ය.

මේ හැරුණු විට සෑම වසරකම රාජ්‍ය, ස්වර්ණ පුස්තක, ගොඩගේ සම්මානලාභී නවකතා ද මේ පුස්තකාලයේදී ඔබට පරිහරණය කළ හැකි වේ.

පාඨකයින් පුස්තකාලයට පැමිණෙන තෙක් බලා නොසිට පුස්තකාලය පාඨකයින් වෙත රැගෙන යාමේ වැඩසටහන් පෙළක් ද බැද්දගාන මහජන පුස්තකාලය ක්‍රියාවට නංවයි. එහි එක් පියවරක් වන 'ජංගම පුස්තකාල සේවය' පිළිබඳ විශේෂයෙන් සඳහන් කළ යුතු ය. පාසල් හා දහම් පාසල් ආශ්‍රිතව කියවීමේ කඳවුරු පැවැත්වීම මේ අතර වේ.



10 පිටුවට

9 වැනි පිටුවෙන්...

ආර්ථික අපහසුකම් සහිත පිරිස් බහුලව ජීවත්වන සහ පුස්තකාලයෙන් දුර බැහැර ජීවත්වන මවුපියන්ගේ කාර්යබහුලත්වය හේතුවෙන් පුස්තකාලය වෙත පැමිණීමේ හැකියාවක් නොමැති ඇතුල්කෝට්ටේ මාලිගාව පාර ප්‍රදේශයේ වෙසෙන දරු දැරියන් වෙනුවෙන් දෙසතියකට වරක් සෙනසුරාදා දිනවල ජංගම පුස්තකාල සේවාවක් ක්‍රියාවට නැංවේ.

දරු දැරියන් තුළ සෞන්දර්යාත්මක හැකියාවන් වැඩිදියුණු කිරීම අරමුණු කරගෙන චිත්‍ර, අත්කම් නිර්මාණ, වැඩමුළු හා ගීත රසවින්දන වැඩමුළු ද පැවැත්වේ.

පාඨකයින් තුළ ආධ්‍යාත්මික සුවය වර්ධනය කරනුවස් ධර්ම දේශනා, පිරිත් දේශනා වැඩසටහන් ද පැවැත්වේ.


බැද්දගාන මහජන පුස්තකාලය ඔබ සතු වටිනා පොත් පත් පරිත්‍යාග කිරීමේ අවස්ථාව පරිත්‍යාගශීලී ඔබ වෙනුවෙන් සලසා ඇත. ඔබ පරිහරණය කළ පොත් පුස්තකාලයේ අවශ්‍යතාව සැලකිල්ලට ගෙන භාරගැනීමට සූදානම් ය. 0112 869 757 දුරකථන අංකය අමතා ඒ සම්බන්ධව වැඩිදුර තොරතුරු ඔබට දැනගත හැකි ය.

නවීන තාක්ෂණික පහසුකම් සමගින් ඉදිරියට ගොස් ඇති බැද්දගාන මහජන පුස්තකාලය සාමාජිකයින්ගේ පහසුව සැලකිල්ලට ගෙන ඩිජිටල් සාමාජික කාඩ් පතක් ද හඳුන්වා දී තිබේ.

සිකුරාදා, පෝය හා ප්‍රසිද්ධ නිවාඩු දින හැරුණු විට අනෙක් දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 5.15 දක්වා මෙම මහජන පුස්තකාලය ඔබ වෙනුවෙන් විවෘතව ඇත.

**අනුර යහම්පත්**

## අප පුස්තකාලයන්හි ඇති සම්මානලාභී කෘති කිහිපයක්




**මෙම කෘතීන් පාඨක ඔබට අපගේ රාජගිරිය, නුගේගොඩ, උඩහමුල්ල, බැද්දගාන යන මහජන පුස්තකාලවලින් ලබාගත හැකිය**



# කෝට්ටේ දියුණුවට

## පුරවැසි ඔබගේ සහයෝගය අත්‍යවශ්‍යයි





නගර සැලසුම්කරණය හා නගර නිර්මාණකරණය මේ වන විට ඉතාමත් පුළුල් වූද ක්‍රමානුකූල වූද කාර්යයක් බවට පත්ව තිබේ. මේ කාර්යයේදී ඒ ප්‍රදේශවල පළාත් පාලන ආයතන වෙත පැවරී ඇත්තේ ඉතාමත් භාරදූර වගකීමකි.

වර්තමානයේදී ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ රටේ පරිපාලන අගනුවර බවට පත්ව තිබේ. එය වඩාත් විචිත්‍රවත්, සෞඛ්‍යාරක්ෂිත පුරවරයක් බවට පත්කිරීමෙහිලා වූ වගකීමෙන් සැලකිය යුතු කොටසක් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව වෙත පැවරී ඇත.

මේ කාර්යය ඉටුකිරීමෙහිලා මුදුන්පමුණුවා ගැනීමට අපේක්ෂිත ඉලක්කයන් මෙලෙස සාරාංශගත කළ හැකිය.

- **ඓතිහාසික පුරාවස්තු ආරක්ෂා කරගනිමින් කෝට්ටේ පැරණි ශ්‍රී විභූතිය ආරක්ෂා කර ගැනීම**
- **ස්වාභාවික සෞන්දර්යය ආරක්ෂා කර දීම හා සංවර්ධනය කිරීම**
- **බදු ගෙවන ජනතාවගේ මූලික අවශ්‍යතාවන් උපරිම මට්ටමින් ඉටුකිරීම**
- **උසස් මට්ටමේ මහජන සේවාවක් ලබාදීම**
- **මහජන සෞඛ්‍යාරක්ෂාව හා සනීපාරක්ෂාව උපරිම මට්ටමින් සලසා දීම**
- **ජනතාව සමග උසස් මට්ටමේ අන්තර් සම්බන්ධතාවක් පවත්වාගෙන යමින් උපරිම සේවයක් ඉටුකිරීම**
- **ආයතනික සංවර්ධනය මගින් උසස් ප්‍රතිඵල අත්කර දීම**
- **ආර්ථික සංවර්ධනය මගින් ජනතාවගේ ජීවන තත්ත්වය නඟාසිටුවීම**
- **කෝට්ටේ අගනගරය 'සුහුරු නගරයක්' (Smart City) බවට පත්කිරීම.**

මෙම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා විවිධ වූ වැඩපිළිවෙළ හා ක්‍රමවේදයන් අප ආයතනය සතුව තිබේ. මෙහිලා නවීන තාක්ෂණික ක්‍රමෝපායයන්ගේ පිහිටාධාරය ද උපරිමව ලබාගැනීම අපගේ අපේක්ෂාවකි. ඉදිරියේදී අප ක්‍රියාවට නැංවීමට බලාපොරොත්තු වන 'සුහුරු නගර සංකල්පය' (Smart city concept) මේ අතර වේ.

ශ්‍රී ජයවර්ධනපුරවරය විවිධ ක්ෂේත්‍රයන් නියෝජනය කරන උගතුන්ගෙන් නොඅඩු නගරයකි. මේ පිරිස නගරයකට උරුම මිල කළ නොහැකි සම්පතකි. මොවුන් සතුව අප පුරවරයේ දියුණුව කෙසේ සිදුවිය යුතුද? යන කාරණාවට ඉතාමත් සාර්ථක පිළිතුරු තිබීමට පුළුවන. එවැනි අදහස් හා යෝජනා වෙතොත් ඒවා අප වෙත ඉදිරිපත් කරන මෙන් ඉතාමත් ගෞරවණීයව ඉල්ලා සිටින්නෙමු.

මන්ද ඔබගේ පුරවරය වඩාත් යහපත් වාසභූමියක් බවට පමුණුවාලීමෙහිලා බුද්ධිමත් ප්‍රජා දායකත්වය ඉතාමත් වැදගත් කොට සලකන බැවිනි.

**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ කළමනාකරණ කමිටුව**

# පශු වෛද්‍ය සායනය

## සුනඛ සපාකෑම්වලින් මිදෙන්නට



උපදෙස්
කෝට්ටේ මහා නගර සභාවේ
ප්‍රධාන පශු වෛද්‍ය නිලධාරි
රුවිනි එස්. පිඹුරගේ මහත්මිය

# මේ දේවල් පිළිපදිමු

සුනඛ සපාකෑම් හේතුවෙන් දිනකට අප රටේ රෝහල්වලට පැමිණෙන ප්‍රමාණය අතිමහත් ය. ඒ ප්‍රමාණය දෙවැනි වන්නේ හදිසි අනතුරුවලින් රෝහල්වලට පැමිණෙන ප්‍රමාණයට පමණි. එපමණටම සුනඛ සපාකෑම සුලබ උවදුරක් බවට පත්ව තිබේ.

සුනඛ සපාකෑමකදී රෝහල් වෙත යොමුවන රෝගීන් සඳහා නොමිලේ ලබාදෙන ජලභීතිකා පසු එන්නත් ප්‍රතිකාර වෙනුවෙන් රජය වසරකට මිලියන 300 කට අධික මුදලක් වැය කරයි. මෙම වියදම් ද අවම කරගනිමින් ලෙඩ රෝගවලින් තොර නිරෝගී ජීවිතයක් ගතකිරීමට හැකි වන්නේ නම් ඉතාමත් වැදගත් ය.

ඒ සඳහා ගත හැකි එක් පියවරක් වන්නේ සුනඛ සපාකෑම්වලින් ආරක්ෂා වී සිටීම ය. එහිදී පහත ක්‍රියාමාර්ගයන් අනුගමනය කළ යුතු වන්නේය.

- ඔබට නොපුරුදු සුනඛයින් මගහැර ගමන් කරන්න.
- ඔබ නොදන්නා නිවසකට යාමේදී සුනඛයින් පිළිබඳ විමසිලිමත් වන්න.
- සුනඛයින් සිටින නිවෙස්වල 'බල්ලන්ගෙන් ප්‍රවේසම් වන්න' යනුවෙන් සඳහන් දැන්වීමක් ප්‍රදර්ශනය කරන්න.
- නිරතුරුව සපාකෑමට හුරු වී ඇති සුනඛයින්ට කටකලියා පළඳවන්න.
- සතුන් ඉදිරියේදී දිවීම, උසුළු විසුළු කිරීම, අසමාන්‍ය ලෙස අත පය වැනීම වැනි ක්‍රියාවලින් උන් ප්‍රකෝප විය හැකි බැවින් එවැනි ක්‍රියාවලින් වළකින්න.
- තමන්ට නොපුරුදු නාඳුනන සතුන් අතගෑමෙන් හා සුරතල් කිරීමෙන් වළකින්න.
- සතුන් ආහාර ගන්නා විට හෝ පැටවුන් සමග සිටින විට උන් අසළට නොයන්න.



මෑත කාලය තුළදී කුඩා දරුවන් බොහෝ දෙනෙකු සුනඛ සපාකෑම්වලට ගොදුරු වූ බව ජනමාධ්‍ය වාර්තා කළේය. මෙම අවදානම්කාරී තත්ත්වයෙන් ඔබේ කුඩා දරුවන් රැකගැනීමට ඔබ නිරතුරුවම අවධානයෙන් පසුවීම අත්‍යවශ්‍ය කාරණයක් වන්නේය.



නීතියයි ඔබයි

# විවාහයට බලපාන නීතිය



විවාහය යම් කෙනකුගේ ජීවිතයේ ඉතාමත් වැදගත් සන්ධිස්ථානයකි. යමකු විවාහ වීමට නීත්‍යනුකූල සුදුසුකම් 4 ක් සපුරා තිබිය යුතුය. ඒවා මෙසේය.

**1. කැමැත්ත**

**2. සුදුසු වයස**

**3. වලංගු විවාහයකට ඇතුළත්ව නොතිබීම**

**4. විවාහ වීමට බලාපොරොත්තු වන අය අතර තහනම් ඥාති සම්බන්ධතාවක් නොතිබීම.**

දැන් මේ එක් එක් කරුණ ගැන වෙන වෙනම පැහැදිලි අවබෝධයක් ලබාගනිමු. විවාහයක් සිදුවීමට නම් ඒ දෙදෙනා එකිනෙකා සමග විවාහයට කැමැත්තක් තිබිය යුතුය.

එක් අයකුට තවත් අයකු බලහත්කාරයෙන් විවාහ කරවිය නොහැකි ය. බලහත්කාරයෙන් කෙනකු ඔබට විවාහ කර දෙන්නට තැත් කරන්නේ නම් මේ විවාහයට තමන්ගේ ඇති අකැමැත්ත වහාම විවාහ රෙජිස්ට්‍රාර්වරයාට දැනුම් දිය යුතුය.

එසේ කරන අවස්ථාවේදීත් යම් බලපෑමකට යටත්ව ඔබ විවාහ කරවූවා නම් වහාම නීතිඥ උපදෙස් ලබාගත යුතුය.

විවාහ වීමට නම් වයස අවුරුදු 18 සම්පූර්ණ විය යුතුය. මෙම වයසට අඩු අයකු සමග සිදුවන විවාහය නීතියට අනුව වලංගු විවාහයක් වන්නේ නැත. දෙමාපිය කැමැත්ත තිබුණද වයස අවුරුදු 18 ට අඩු අයෙකු සමග විවාහ වීමට නීතියෙන් ඉඩක් නැත.

විවාහ වීමට බලාපොරොත්තු වන අයකු වලංගු විවාහයකට ඇතුළත් වී නොතිබිය යුතුය. ඔබ කලින් විවාහ වූ අයකු යැයි සිතමු. ඔබ ඊළඟ විවාහයට යාමට පෙර මුල් විවාහය නීත්‍යනුකූලව අවසන් කළ යුතුය. නීත්‍යනුකූලව අවසන් කිරීම ලෙස හඳුන්වන්නේ නිසි බලය තිබෙන දිසා අධිකරණයක නඩුවක් පවරා එම නඩුවෙන් ඉෙනසයි තීන්දුවක් ලබාගත යුතුය. එම තීන්දුව නියත තීන්දුවක් බවට පත්විය යුතුය.



දික්කසාද ඉෙනසයි තීන්දුව නියත තීන්දුවක් බවට පත්වුවද තවත් දින 14 ක් ගතකිරීම නුවණට හුරු ය. මන්ද ඒ නියෝගය සම්බන්ධයෙන් අභියාචනයක් තිබිය හැකි නිසා ය. දින 14 ක් ගෙවුණු පසුව අදාළ නියත තීන්දුවේ පිටපතක් ලබාගෙන නව විවාහයට පිවිසීමට හැකියාව ලැබේ.

එසේ නැත්නම් මේ වන විට ඔබගේ පෙර විවාහයේ සහකරු හෝ සහකාරිය මියගොස් තිබිය යුතුය.

වලංගු විවාහයක් තිබියදී නැවත විවාහ වුවහොත් ඔබ 'බහු විවාහය' නමැති අපරාධයට දඬුවම් විඳීමට ඉඩ කඩ ඇත.

විවාහ වීමට බලාපොරොත්තු වන අයකුහට තහනම් ඥාති සබඳතා නොතිබිය යුතුය. එනම් ලේ ඥාතීන් අතර විවාහයක් සිදුවීමට නීත්‍යනුකූල අවසරය ලැබෙන්නේ නැත.

ඔබ පුරුෂයකු නම්, ඔබට ඔබගේ මව සමග, සහෝදරියක සමග, මවගේ සහෝදරියක සමග, තම දියණියක සමග, ඔබගේ පියාගේ සහෝදරියක සමග, ඔබගේ සහෝදරියකගේ දියණියක සමග විවාහ වීමට නීතියෙන් අවසර ලැබෙන්නේ නැත.

ඔබ ස්ත්‍රියක් නම්, ඔබට ඔබගේ පියා සමග, සහෝදරයකු සමග, පුතකු සමග, පියාගේ සහෝදරයකු සමග, පියාගේ සහෝදරයකුගේ දරුවකු සමග විවාහ වන්නට නීතිමය අවසරයක් නොලැබේ.

විවාහය පමණක් නොව ලේ ඥාතීන් සමග ලිංගික සබඳතා පැවැත්වීම ද බරපතළ වරදකි. එය 'ව්‍යාභිචාරය' නම්වන්නේය.

ඔබත් විවාහයට පෙර එහි නීතිමය තත්ත්වය හොඳින් තේරුම් ගැනීමට බුද්ධිමත් විය යුතුය.



උපදෙස්
නීතිඥ චානක අබේවික්‍රම මහතා

# මිශ්‍ර ආදායම් අංශය

## පොදු සේවාවන් රැසක් සැලසෙන

ශ්‍රී ලංකාවේ පරිපාලන අගනගරයේ පිහිටි ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව වෙත පැවරී ඇති වගකීම් ප්‍රමාණය අතිමහත් ය. ඒවා ක්‍රමානුකූලව ඉටුකිරීම සඳහා මහා නගර සභාව ප්‍රධාන අංශ කිහිපයක් යටතේ මහජනතාව වෙත සේවය සලසයි. මිශ්‍ර ආදායම් අංශය මින් එකකි.

මිශ්‍ර ආදායම් අංශය මගින් ඉටුවන සේවාවන් පිළිබඳ පුළුල් අවබෝධයක් ලැබීමෙන් ඒ අංශයෙන් ඔබට සැලසෙන සේවාවන් පහසුවෙන් ඉටුකර ගත හැකි ය. එම සේවාවන් පිළිවෙළින් මෙසේ ය. (මෙම සේවාවන් ලබාගැනීමට ඉදිරිපත් කළ යුතු ලේඛන ● ලකුණෙන් දැක්වේ)

**සියලුම වෙළෙඳ සංකීර්ණ අධීක්ෂණ කටයුතු සහ ඵලදායී පරිපාලනය මගින් නගර සභා බල ප්‍රදේශයේ සංවර්ධනය සඳහා යෙදවීම**

- කඩ අංකය
- කඩ හිමියාගේ නම

**වෙළෙඳ බලපත්‍ර/ව්‍යාපාර බලපත්‍ර නිකුත් කිරීම**

- ව්‍යාපාර ලියාපදිංචි සහතිකය
- අනුමත ගොඩනැගිලි සහතිකය
- භාවිතය වෙනස් වීමේ සහතිකය
- අනුකූලතා සහතිකය

**ජංගම වෙළෙඳාමේ යෙදෙන අය වෙනුවෙන් තාවකාලිකව භූමි වෙන් කරවාගැනීම**

- ඉල්ලීම් ලිපිය
- ජාතික හැඳුනුම්පතේ පිටපතක්
- ග්‍රාමසේවා සහතිකය

**මගී ප්‍රවාහණයේ යෙදෙන ත්‍රිරෝද රථ එම රථ ගාල්වල නතර කර තැබීම සඳහා වන බලපත්‍රය නිකුත් කිරීම**

- ත්‍රිරෝද රථ සංගමයේ සහතිකය
- වාහන ආදායම් බලපත්‍රය
- ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක්

**සංචාරක වෙළෙඳ බලපත්‍ර නිකුත් කිරීම**

- අදාළ වරලත් ගණකාධිකාරීවරයා විසින් සහතික ලත් අවසාන ගිණුම් වාර්තාවේ මුල් පිටපත
- අනුමත ගොඩනැගිලි සහතිකය
- භාවිතය වෙනස් වීමේ සහතිකය අනුකූලතා සහතිකය

**දැන්වීම් පුවරු/බැනර්/කටවුට් සවිකිරීම නියාමනය කිරීම**

**මෙහිදී අයදුම් පත්‍රය සමග ලබාදිය යුතු අනෙක් තොරතුරු මෙසේ ය.**

- දැන්වීම් පුවරුවේ ප්‍රචාරය කරනු ලබන දැන්වීමේ පින්තූරය (Art work)
- පුවරුවේ යකඩ සැකිල්ලේ සටහනක් හා අනෙකුත් විස්තර (සිවිල් ඉංජිනේරු සහතිකය සමග)
- පුවරුව සවිකරන ස්ථානයේ ඡායාරූපයක්
- පෞද්ගලික ගොඩනැගිල්ලක් නම් එම ගොඩනැගිල්ල හිමිකරුගේ විරුද්ධත්වයක් නොමැති බවට ලිපියක්
- එම ගොඩනැගිල්ල හෝ ස්ථානය සඳහා වරිපනම් බදු, වෙළෙඳ බදු හෝ වෙළෙඳ බලපත්‍ර ගාස්තු ගෙවූ රිසිට් පතක් හා එහි ඡායා පිටපත්
- එම පුවරුව ලබාගත් රක්ෂණ ආවරණය
- කසළ බදු ගෙවූ රිසිට් පත හා එහි ඡායා පිටපතක්
- Google map මගින් ලබාගත් පිටපතක අදාළ ස්ථානය නිවැරදිව ලකුණු කර පෙන්විය යුතුය.

**බ්‍රෝකර් සහ වෙන්දේසි බලපත්‍ර නිකුත් කිරීම**

- ග්‍රාම නිලධාරී සහතිකය
- ජාතික හැඳුනුම්පතේ පිටපතක්
- ඉල්ලීම් ලිපිය

**ලොතරැයි කුටි නියාමනය**

- ස්ථානීය ඡායාරූපයක්
- ග්‍රාම නිලධාරී සහතිකය

මෙකී සේවාවන්ට අදාළ ගෙවීම් මහා නගර සභාවට හෝ කොට්ඨාස කාර්යාලවලට පැමිණ කළ යුතුය. මාර්ගගත (Online) ක්‍රමයට ගෙවීම් සිදුකළ නොහැකි ය.



උපදෙස්
අශිකා හෙට්ටිහේවා
ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී

# ගොඩනැගිලි සීමාව සහ වීථි රේඛාව ගැන දැනගනිමු



වීථි රේඛාව යනුවෙන් පවත්නා ඕනෑම වීථියක එක්පසම හෝ දෙපසම අර්ථ දක්වා ඇති රේඛාවක් හෝ රේඛා අදහස් වන අතර, අදාළ පළාත් පාලන ආයතනය, මාර්ග සංවර්ධන අධිකාරිය, පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරිය විසින් අනුමත කර ඇති පරිදි අදාළ මාර්ගය අනාගතයේදී පුළුල් කිරීමට යෝජිත පළල නිරූපණය කරනු ලබන රේඛාව වේ.

ගොඩනැගිලි සීමාව ලෙස සලකනු ලබනුයේ යම් වීථියකින් ප්‍රවේශය ලබන බිම් කට්ටියක ඉදිකිරීමක් සිදුකිරීමේදී ඊට එකී වීථියේ මධ්‍යයේ සිට හෝ අදාළ මායිමේ සිට තැබිය යුතු දුර ප්‍රමාණය වේ. මේ දුර ප්‍රමාණය පනවනු ලබනුයේ ඉහත කී ආයතනයන් සහ ඊට අමතරව නාගරික සංවර්ධන අධිකාරිය ද විසිනි.

අනාගතයේදී යම් වීථියක පුළුල් කිරීමක් සිදුකරන්නේද යන්න පිළිබඳ සහ ඒ වෙනුවෙන් එහි දෙපසින් වූ බිම් කට්ටිවලින් යම් අත්පත් කිරීමක් සිදුකරන්නේද යන්න පිළිබඳ දැනගැනීමට වීථි රේඛාව ප්‍රයෝජනවත් වේ.

ගොඩනැගිලි සීමාව මගින් එකී බිම් කට්ටිවල යම් ඉදිකිරීමක් සිදුකිරීමේදී ඒ සඳහා ඉහතින් දැක්වූ ලෙස තැබිය යුතු වන දුර ප්‍රමාණයන් දැනගත හැකි වේ.

අදාළ වූ අයදුම්පත් මිල දී ගෙන එය නිවැරදිව පුරවා පහත සඳහන් ලේඛන ද සමග ආපසු මහා නගර සභාව වෙත භාරදීමෙන් ගොඩනැගිලි සීමා සහතික සහ වීථි රේඛා සහතික ඔබට ලබාගත හැකි වනු ඇත (මේ සඳහා පෙර ගෙවුම් ගාස්තුවක් ද අයකරනු ලැබේ).

- **මහා නගර සභාව හා නාගරික සංවර්ධන අධිකාරිය විසින් අනුමත කරන ලද හෝ අනුමත නොකරන ලද බිම් කට්ටි සැලසුමක ඡායා පිටපත් 2 ක්,**
- **වරිපනම් ලේඛනයේ නම සඳහන් අයිතිකරුගේ හෝ අයිතිකරුවන්ගේ ජාතික හැඳුනුම් පතේ ඡායා පිටපත් (අයදුම්පතේ අත්සන් තැබිය යුත්තේ ද මේ අයයි).**
- **අදාළ වර්ෂයේ වරිපනම් බදු ගෙවූ රිසිට් පතක හෝ වලංගු නොපවරා ගැනීමේ සහතිකයක ඡායා පිටපතක්.**
- **යම් ආයතනයක් මෙම සහතික අයදුම් කරන විටදී ඉහතින් දැක්වූ ලේඛනවලට අමතරව එහි ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපතක් ද ඉදිරිපත් කළ යුතු අතර එහි අධ්‍යක්ෂවරයකු හෝ බලය පවරා ඇති පුද්ගලයකු අයදුම්පතේ අත්සන් කළ යුතු වේ.**

මෙම ලේඛන සමග අයදුම්පත පුරවා භාර දීමෙන් අනතුරුව එක් දිනක් තුළ හෝ එදිනම මෙම සහතික ලබාගත හැකි වන්නේය.

**උපදෙස්**
**නාගරික සැලසුම් අංශය**

# ශ්‍රී පුර පුවත්

## කෝට්ටේ ප්‍රථම පුරපති චන්ද්‍රා සිල්වා මැතිතුමන්ගේ 20 වැනි ගුණ සමරුව



ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ අග නගරයේ දියුණුව උදෙසා කීර්තිමත් යුග මෙහෙවරක නිරත වූ කෝට්ටේ මහා නගර සභාවේ ප්‍රථම නගරාධිපති නීතිඥ චන්ද්‍රා සිල්වා මැතිතුමාගේ **20** වැනි ගුණ සමරු උළෙල **2023** දෙසැම්බර් **26** වැනි දින රාජගිරියේ පිහිටි එතුමා සිහිවීම පිණිස ඉදිකර ඇති පිළිරුව අභියසදී පැවැත්විණි.

මහා සංඝරත්නයේ ආශීර්වාදය හා අනුශාසනාවන් ලබමින් පැවැති මෙම උත්සවය සඳහා කොළඹ දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී මේජර් ප්‍රදීප් උඳුගොඩ මැතිතුමා, කෝට්ටේ හිටපු නගරාධිපති අයි. එම්. වී. ප්‍රේමලාල් මැතිතුමා, හිටපු නගරාධිපතිනී ස්වර්ණා සිල්වා මහත්මිය, කෝට්ටේ මහා නගර සභාවේ නාගරික ලේකම් එච්. එම්. දයාරත්න මහතා, සහකාර නාගරික ඉංජිනේරු අජිත් හෙට්ටිආරච්චි මහතා ඇතුළු මහා නගර සභා කාර්ය මණ්ඩලය හා කෝට්ටේ පුරවැසි ජනතාව එක්වූහ.

## කෝට්ටේ පුරවැසියන්ට තවත් පහසුකමක්

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව මගින් උඩහමුල්ල පොදු සුසාන භූමියේ ඉදිකෙරෙමින් පවතින මෘත දේහයන් තැන්පත් කර තැබීමේ පහසුකම් සහිත ගොඩනැගිල්ල **(Funeral parlour)** ඉදිකිරීමේ 2 වැනි අදියර ආරම්භ කිරීමේ උත්සවය කොළඹ දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපති නීතිඥ මධුර විතානගේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

මෙම අවස්ථාව සඳහා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කසුන් ඇපා සෙනෙවිරත්න මහතා, නාගරික කොමසාරිස් ආර්. ඒ. ශාලිකා එස්. රණවීර මහත්මිය ඇතුළු මහා නගර සභා නිලධාරීහු පිරිසක් සහභාගී වූහ.

මෙවැනිම ගොඩනැගිල්ලක් නාවල පොදු සුසාන භූමියේ ද ඉදිකෙරෙමින් පවතී.

## බණ්ඩාරනායකපුර ජනතාව වෙනුවෙන් නොමිලේ සෞඛ්‍ය සායනයක්



‘ඔබේ සුවසෙතට අපෙන් අත්වැලක්’ තේමාවෙන්, නුගේගොඩ ප්‍රධාන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව, හේමාස් පුද්ගලික රෝහල සහ මධුර විතානගේ පදනම එක්ව සංවිධානය කරන ලද සෞඛ්‍ය සායනයක් 2023 දෙසැම්බර් 16 වැනි දින බණ්ඩාරනායකපුර ස්වර්ණා සිල්වා උත්සව ශාලාවේදී පැවැත්විණි.


බණ්ඩාරනායකපුර ප්‍රදේශවාසීන් වෙනුවෙන් මෙම සායනය නොමිලේ පැවැත්විණි. මෙහිදී ඇස් පරීක්ෂාව, රුධිරගත සීනි පරීක්ෂාව, කොලෙස්ටරෝල් පරීක්ෂාව, දන්ත සායනයක්, චර්ම රෝග පරීක්ෂාවන්, ගැබ් ගෙළ හා පියයුරු පිළිකා හඳුනාගැනීමේ පරීක්ෂාවන්, ළමා රෝග සායනයක්, ජලභීතිකා රෝග මර්දනය සඳහා සතුන් එන්නත්කරණය කෙරිණි.

## නිර්මාණශීලී දූ දරුවන්ට බැද්දගාන පුස්තකාලයෙන් අත්වැලක්



දූ දරුවන්ගේ නිර්මාණශීලී කුසලතාවන් වර්ධනය කිරීම අරමුණු කොටගෙන බැද්දගාන මහජන පුස්තකාලය විසින් සංවිධානය කරනු ලැබූ අත්කම් නිර්මාණ වැඩමුළුවක් 2023 දෙසැම්බර් 10 වැනි දින එම පුස්තකාලයේදී පැවැත්විණි. මෙම අවස්ථාවට කෝට්ටේ මහජන පුස්තකාලයන්හි ප්‍රධාන පුස්තකාලයාධිපති සුජීව ප්‍රනාන්දු මහතා සහ බැද්දගාන මහජන පුස්තකාලයාධිපතිනී මංජුලා පීරිස් මහත්මිය හා එම පුස්තකාල කාර්ය මණ්ඩලය එක්වූහ.

## මහා නගර සභා වර්ෂ අවසාන ධර්ම දේශනාව



ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ බෞද්ධ සංගමය විසින් සංවිධානය කරනු ලබන මාසික ධර්ම දේශනා මාලාවේ වර්ෂ අවසාන ධර්ම දේශනාව 2023 දෙසැම්බර් 22 වැනි දින මහා නගර සභා ප්‍රධාන ශාලාවේදී පැවැත්විණි. මෙවර ධර්ම දේශනාව පවත්වන ලද්දේ විචිත්‍ර ධර්ම කථික ශාස්ත්‍රවේදී පූජ්‍ය හංවැල්ලේ මේධංකර ස්වාමීන් වහන්සේ විසිනි.

මෙවර ධර්ම දේශනා පින්කමේ දායකත්වය දරන ලද්දේ මහා නගර සභා මිශ්‍ර ආදායම් අංශය, ගබඩා අංශය, මිල දී ගැනීම් අංශය හා ආදායම් පරීක්ෂක අංශය විසිනි. පසුගිය උඳුවප් පොහොය නිමිත්තෙන් පින්කම සංවිධානය කෙරිණි.

## මහා නගර සභා 'මහජන දිනය' සෑම සඳුදාවකම

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාවේ නාගරික කොමසාරිස් ආර්. ඒ. ශාලිකා එස්. රණවීර මහත්මියගේ මූලිකත්වයෙන් සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ සහභාගිත්වයෙන් 'මහජන දිනය' සෑම සඳුදා දිනයකම පෙරවරු 10.00 මධ්‍යහ්න 12.00 දක්වා මහා නගර සභා ප්‍රධාන ශාලාවේදී පැවැත්විණි.

මහා නගර සභාවෙන් විසඳගැනීමට ඇති ගැටලුවලට පිළිතුරු ලබාගැනීම, නිලධාරීන් හමුවීම ඇතුළු කටයුතු වෙනුවෙන් මෙම දිනය ප්‍රයෝජනයට ගන්නා මෙන් නාගරික කොමසාරිස්තුමිය කෝට්ටේ ප්‍රදේශවාසීන්ගෙන් ඉල්ලා සිටියි.

## වික්ටෝරියා නිවාසයට නව මානසික සෞඛ්‍ය ඒකකයක්



රාජගිරිය වික්ටෝරියා ආබාධිත නිවාසයේ නේවාසික ප්‍රජාවගේ සිත් සුවපත් කරනුවස් Friends of Victoria නම් වූ අභිනව මානසික සෞඛ්‍ය ඒකකයක් 2023 නොවැම්බර් 27 වැනි දින එම නිවාසයේ පාලක මණ්ඩලයේ සභාපති කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ ලේකම්, දිසාපති කේ. ජී. විජේසිරි මහතා විසින් විවෘත කරන ලදී.

මෙම අවස්ථාවට හිටපු අමාත්‍යාංශ ලේකම් මහින්ද මඩිහේවා මහතා, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කසුන් ඇපා සෙනෙවිරත්න මහතා ඇතුළු පිරිසක් එක්වූහ.

මේ කාර්යය සඳහා සම්පත් දායකත්වයෙන් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ උපදේශන නිලධාරී ලලිත් වන්නිආරච්චි මහතා ද මූල්‍ය දායකත්වයෙන් MANNG පදනමේ අධ්‍යක්ෂ නීතිඥ විජිත මනම්පේරි මහතා ද දායක වී සිටිති.



18 පිටුවට

# රාජ්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීමට පියවර ගැනේ

ශ්‍රී ජයවර්ධනපුර කොට්ඨාසය තුළ තෝරාගත් රාජ්‍ය ආයතනයක ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සහ එම ආයතනය තුළ **5 S** ඵලදායිතා සංකල්පය ක්‍රියාත්මක කර සහතික කිරීම සඳහා යොමුකිරීමේ වැඩසටහනක් 2023 නොවැම්බර් 22 වැනි දින රාජගිරිය මධ්‍ය පුස්තකාලයේදී පැවැත්විණි.

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම්තුමාගේ සහ සහකාර ලේකම්තුමියගේ මගපෙන්වීම යටතේ පැවැති මෙම වැඩසටහන සංවිධානය කරන ලද්දේ වසම් භාර නිලධාරිනී ප්‍රදීපා සමංජලී මෙනෙවිය හා ඵලදායිතා නිලධාරිනී හිරන්ති අල්විස් මහත්මිය විසිනි.

## හේවාවිතාරණ විදු මවට කීර්තියක් උරුම කර දුන් දියණියෝ



ශ්‍රීමත් ජෝන් ටාබට් සමස්ත ලංකා වයස අවුරුදු 13 න් පහළ මීටර් 200 ඉසව්වෙන් නව තරග වාර්තාවක් සමගින් රන් පදක්කමක් සහ දුර පැනීමේ ඉසව්වෙන් රන් පදක්කමක් දිනාගැනීමට රාජගිරිය හේවාවිතාරණ විද්‍යාලයේ ලසිකා ස්වර්ණමාලී ශිෂ්‍යාව සමත් වූවාය. අවුරුදු 15 න් පහළ මීටර් 200 හා මීටර් 400 ඉසව් දෙකෙන්ම පරිසාධන මට්ටම ඉක්මවීමටද එම විදුහලේම ගයත්‍රි උපේක්ෂා ශිෂ්‍යාව සමත් වූවාය.

අතිදක්ෂ මලල ක්‍රීඩා පුහුණුකරුවකු වන දිමුතු මුදලිගේ මහතා විසින් මෙම ක්‍රීඩිකාවන් පුහුණු කරවනු ලැබිණි.

## ෂෙෆීල්ඩ් ශිෂ්‍ය නායක නායිකාවෝ දිවුරුම් දෙති



පිටකෝට්ටේ ෂෙෆීල්ඩ් ජාත්‍යන්තර පාසලේ ශිෂ්‍ය නායක නායිකාවෝ 2023-2024 වර්ෂය සඳහා දිවුරුම් දීමේ උත්සවය පසුගියදා එම පාසලේදී පැවැත්විණි. පාසල් අධ්‍යක්ෂිකා නිල්මිණී දිසානායක මහත්මිය සහ කෝසල දිසානායක මහතා සහ දෙමවුපියෝ මේ අවසථාවට සහභාගී වූහ.

## රාජගිරිය 'ජන ජය සිටි' වෙළෙඳ සංගමයෙන් ලේ දන්දීමේ කඳවුරක්





රාජගිරිය 'ජන ජය සිටි' වෙළෙඳ සංගමය විසින් ප්‍රථම වරට සංවිධානය කරනු ලැබූ ලේ දන් දීමේ කඳවුරක් 2023 නොවැම්බර් 15 වැනි දින එම වෙළෙඳ සංකීර්ණයේදී පැවැත්විණි. රටේ උද්ගතව ඇති උග්‍ර ලේ හිඟ යට පිළියමක් ලෙසින් සංවිධානය කරන ලද මේ පුන්‍යකර්මය වෙනුවෙන් විශාල ජනතා සහභාගීත්වයක් හිමි වූ බව එම සංගමය පවසයි.

ශ්‍රී පුර

සාඩම්බර අගනගරයක ජනතා ආමන්ත්‍රණය

**E magazine පළ කෙරෙනුයේ කෝට්ටේ පුරවැසි ඔබ වෙනුවෙනි.**

**ඔබගේ අදහස්, යෝජනා හා ප්‍රාදේශීය පුවත් අපට ලියා එවන්න.**

Email:kmcmediaunit3@gmail.com




# ගතට මෙන්ම සිතටද අභ්‍යාසයක් වන ක්‍රීඩාවක්

# DRAGON BOAT



'ඩ්‍රැගන් බෝට්' යනු අඩු කාලයකින් තමන්ට හැකි පමණින් බෝට්ටු පැද ජයග්‍රහණය කළ හැකි ක්‍රීඩාවකි. මේ ක්‍රීඩාවේ ශ්‍රේණි 2 ක් තිබේ. මේ එක් එක් ශ්‍රේණියකට අයත් බෝට්ටුවක ආසන 10 සහ ආසන 20 වශයෙන් වර්ග 2 ක් ඇත. ධාවකයින් දෙදෙනකු බැගින් එක ළඟින් මෙම ආසනවල අසුන්ගත යුතුය. එම ධාවකයින් සතු හබල් ඉතාමත් සාමාන්‍ය ඒවා වේ. බෙර වාදකයෙක් (Drummer) සහ බෝට්ටුවේ පිටුපසින් හිඳ හබල් ගසන්නෙක් (Steerer) මෙම ශ්‍රේණී දෙකේම සිටිති. බෝට්ටුවේ සිටින සෑම තරගකරුවකුම හබල් ගැසිය



යුතු වන්නේ පෙර සඳහන් Drummer වාදනය කරන තාලය අනුවය.

මෙම ක්‍රීඩාව ලොව පුරා රටවල් 20 ක පමණ ප්‍රචලිතව පවතී. මෙය හුදෙක් ක්‍රීඩාවක් පමණක් නොව කණ්ඩායම් හැඟීම් උත්තේජනය කිරීමට මෙන්ම මානසික රසාස්වාදයක් ඇතිකරවීමට ඉවහල් වන අභ්‍යාසයක් ලෙසින් ද ප්‍රචලිතව ඇත. මෙය බාල, තරුණ, වැඩිහිටි ඕනෑම අවධියක පසුවන කාහටත් සුදුසු අභ්‍යාසයක් ලෙසින් පිළිගැනේ.

ඩ්‍රැගන් බෝට් ක්‍රීඩාවේ ඉතිහාසය වසර 2000 ක පමණ අතීතයකට විහිද යන්නකි. මෙම ක්‍රීඩාවට මුලින්ම සහභාගී වූයේ චීන ගැමියන් පිරිසකි. එය පැවැත්වූයේ 'ලූනා' මාසය හෙවත් පස්වැනි මස පස්වැනි දිනයේය. ඔවුන් එය සිදුකරනු ලැබුවේ මකර සංක්‍රාන්තිය හෙවත් ඔවුන් දේවත්වයෙන් අදහන මකරාහට පුද සත්කාර කිරීමක් ලෙසිනි.

බුද්ධ වර්ෂ 278 දී චීන ජාතික මහා කවියකු වූ කියු යුආන්ගේ අභාවයත් සමග චීනය තුළ මේ ක්‍රීඩාව වඩාත් ජනප්‍රිය විය. ඊට හේතුව මේ කවියා මිලියුම නම් ගංගාවට පැන සිය දිවි නසාගැනීම නිසාය. ඔහු සිය දිවි නසාගනු දුටු ගැමියෝ සිය මසුන් අල්ලන බෝට්ටු රැගෙන ගොස් ඒවායේ හිඳ බෙර වාදනය කරමින්, හබල් ගසමින් ඔහුගේ දේහය දෙසට මත්ස්‍යයන් පිහිනා ඒම වැළැක්වූහ. එතැන් පටන් ඔවුන් සෑම වසරකම එම දිනය 'දුනවු උත්සවය' ලෙස සමරයි. මෙය ඩ්‍රැගන් බෝට් ක්‍රීඩාවේ ආරම්භය ලෙස සැලකේ.

ඩ්‍රැගන් බෝට්ටු නිර්මාණය කර ඇත්තේ ඉතාමත්

**පාර්ලිමේන්තු මන්ත්‍රී මධුර විතානගේ මැතිතුමා සහ ඩ්‍රැගන් බෝට් සමාජයේ සභාපති සුපෙම් ද සිල්වා මහතා**



විශේෂිත වූ ආකාරයටය. කුළු ගවයකුගේ හිසක්, මුවකුගේ අං තට්ටුවක්, අශ්වයකුගේ කේසර (ගෙළ ප්‍රදේශයේ පිටුපසින් වැවී ඇති දිගු ලොම්), පිඹුරකුගේ ශරීරය, උකුස්සකුගේ නිය, මාළුවකුගේ වරල් සහ ශරීරය යන හැඩයන් එක් කර මේ බෝට්ටුවේ හැඩයද මාළුවකුගේ කොරපොතු මෙන් බෝට්ටුවේ පිටත පෙනුමද නිර්මාණය කර ඇත. හබල්වලින් නිය නිරූපණය වේ. මේ ආකාරයෙන් නිර්මිත බෝට්ටු යොදාගෙන 1976 වර්ෂයේදී හොංකොං ඉන්ටර්නැෂනල් ආයතනය විසින් ඩ්‍රැගන් බෝට්ටු ධාවන තරග පවත්වනු ලැබිණි.



ඩ්‍රැගන් බෝට් තරගයක උණුසුම් අවස්ථාවක්

International Canoe Federation (ICF) ආයතනය මේ වන විට නිල වශයෙන් ඩ්‍රැගන් බෝට් තරග කාණ්ඩ කිහිපයක් මේ සඳහා නිර්දේශ කර ඇත. ඒවා නම් මීටර් 200 හෝ 250, මීටර් 500 සහ මීටර් 2000 වශයෙනි. මීටර් 2000 තරග ඉසව්ව පවත්වනු ලබන්නේ මීටර් 500 ඉසව් 4 ක් ලෙසය. ඉන් අවම වශයෙන් මීටර් 500 ඉසව් 2 ක් හෝ ජයගැනීම අනිවාර්ය වේ. මෙම ඉසව්ව ගැහැනු කණ්ඩායම්, පිරිමි කණ්ඩායම් සහ මිශ්‍ර කණ්ඩායම් යන කාණ්ඩ 3 යටතේම පවත්වනු ලබයි. මිශ්‍ර කණ්ඩායමක් සඳහා ආසන 20 සඳහා අවම වශයෙන් 8 දෙනකුවත් සහභාගි විය යුතු බව නීතියකි (ආසන සඳහා අවම වශයෙන් කාන්තාවන් 4 දෙනෙකි).

දැනට පවත්වා ඇති ලෝක ශූරතාවලින් වැඩිම ප්‍රමාණයක් පවත්වා ඇත්තේ ඇමරිකා එක්සත් ජනපදයේ පිහිටි ලෙයිනර් ගංගාවේදීය. ඒ, 2018 වර්ෂයේදීය. එය ළමා, තරුණ හා වැඩිහිටි යන අංශ යටතේ තරග 90 කින් සමන්විත වූ තරගාවලියකි. මෙයින් වැඩිම පදක්කම් ප්‍රමාණයක් දිනාගත්තේ ජර්මනියයි. රන් පදක්කම් ප්‍රමාණය 16 කි. මෙහිදී ඇමරිකා එක්සත් ජනපදය රන් පදක්කම් 8 ක්ද පිලිපීනය රන් පදක්කම් 5 ක්ද දිනාගත්තේය. මේ වන විට රටවල් 13 ක් ඩ්‍රැගන් බෝට් තරගවලින් ලෝක ශූරතාවයන් දිනාගෙන ඇත. 2020 ඩ්‍රැගන් බෝට් ලෝක ශූරතා තරගාවලිය ඉන්දියාවේ බිලාවල් නදියේදී පැවැත්වීමට ICF කමිටුව විසින් තීරණය කරන ලදී.

ඩ්‍රැගන් බෝට්ටු ක්‍රීඩාව මේ වන විට ශ්‍රී ලංකාව තුළද ශීඝ්‍රයෙන් ප්‍රචලිත වෙමින් තිබේ. ඒ, ශ්‍රී ලංකා නාවික හමුදාව, ක්‍රීඩා සමාජ, පාසල් මට්ටමෙන් තරග පවත්වමිනි. මේ පුරෝගාමී කටයුත්තේ මූලිකත්වය ගෙන කටයුතු කරනුයේ කොළඹ දිසත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ මධුර විතානගේ මැතිතුමාය.

මෙම වැඩපිළිවෙළේ ආරම්භක පියවර වශයෙන් හෙතෙම වර්තමාන නාවික හමුදාපතිතුමන් සමග සාකච්ඡා කර ශ්‍රී ජයවර්ධනපුර කලාපයේ බාලක හා බාලිකා පාසල් කිහිපයක දරු දැරියන් සඳහා ඩ්‍රැගන් බෝට්ටු ක්‍රීඩාවේ පුහුණුව නොමිලේ ලබාදීමට පියවර ගත්තේය.

මෙම පුහුණුව ගොඩ පිහිනුම් සහ ජල පිහිනුම් ලෙසින් සිදුකෙරේ. පුහුණුවීම්වලට එක්වන ආධුනිකයින් එක වරම ජල පුහුණුවට යොමු නොකෙරේ. මූලිකවම බෝට්ටුව තුළ වාඩිවන ආකාරය, හබල අල්ලාගන්නා ආකාරය, බෝට්ටුව පදවන ආකාරය යනාදී හැම අංගයක් සම්බන්ධවම මෙම දරු දැරියන්ට සම්පූර්ණ පුහුණුව ලබාදේ. ඉන් අනතුරුව ඔවුන් දියඹට රැගෙන ගොස් පුහුණු කරවයි. එහිදී ඔවුන්ගේ ආරක්ෂාව කෙරෙහි උපරිම මට්ටමෙන් සැලකිලිමත් වේ.

මාසයක් පමණ කාලයකදී පුහුණුව ලැබූ දරු දැරියෝ 2023 දෙසැම්බර් 02 වැනි දින දියවන්නා ඔය අසබඩ නාවික හමුදා ඩ්‍රැගන් බෝට් මධ්‍යස්ථානයේදී මුල්ම ඩ්‍රැගන් බෝට් තරගයට සහභාගී වූහ. එහිදී බාලක අංශය සඳහා පැවැති තරගයෙන් මාලබේ පිරිමි ආදර්ශ විද්‍යාලය ප්‍රථම ස්ථානයද කෝට්ටේ ශ්‍රී ජයවර්ධනපුර මහා විද්‍යාලය දෙවැනි ස්ථානයද රාජගිරිය ජනාධිපති විද්‍යාලය තුන්වැනි ස්ථානයද හිමි කරගත්තේය.

බාලිකා අංශය සඳහා පැවැති තරගයේදී නාවල ජනාධිපති බාලිකා විද්‍යාලය ප්‍රථම ස්ථානයද නුගේගොඩ සමුද්‍රාදේවි බාලිකා විද්‍යාලය දෙවැනි ස්ථානයද හිමි කරගත්තේය.

මාසයක් වැනි ඉතාමත් කෙටි කාලයක් තුළදී ලද පුහුණුවක් මගින් තරගයට එක්ව ජයග්‍රහණය ලැබූ පාසල් දරු දැරියන්ගේ දක්ෂතාවන් ඩ්‍රැගන් බෝට් සමාජයේ සභාපති සුපෙම් ද සිල්වා මහතාගේ නොමඳ ඇගයීමට හා පැසසුමට ලක් විය.

2024 වර්ෂයේ අප්‍රේල් මාසයේදී පැවැත්වීමට නියමිත මීළඟ ඩ්‍රැගන් බෝට් තරගය සඳහා මීට වැඩි පාසල් සංඛ්‍යාවක් සහභාගී කරවාගැනීමට බලාපොරොත්තු වන බව කොළඹ දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නීතිඥ මධුර විතානගේ මහතා පැවසීය.

**තිළිණ සම්පත්**



# අප ගෙවතු වගාවක් ආරම්භ කළයුත්තේ ඇයි?

**ගෙවතු වගාව අද එක්තරා විලාසිතාවක් තරමට ජනප්‍රිය විනෝදාංශයක් බවට පත්ව තිබේ. එය ඉතාමත් හොඳ තත්ත්වයකි. ක්‍රමවත් ගෙවතු වගාවක් තුළින් අපට ළඟා කරගත හැකි වාසි රාශියක් පිළිබඳ මේ විශේෂාංගය යටතේ පසුගිය කලාපයේ පළවූ පළමුවැනි ලිපියෙන් අපි සාකච්ඡා කළෙමු.**

**මෙවර අපගේ අවධානය යොමු වන්නේ අපි ගෙවතු වගාවක් ආරම්භ කළ යුත්තේ ඇයි? හෙවත් එදිනෙදා ජීවිතයේදී අපට අවශ්‍ය වන හව බෝග අපම නිපදවාගත යුත්තේ ඇයි? යන පැනයට පිළිතුරු සොයාගැනීම උදෙසාය. ඒ පිළිබඳ තේමාවන් කිහිපයක් යටතේ කරුණු සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන්නෙමු.**

## අපේ ගෙවත්ත



### වෙළෙඳ පොළේ ආහාර බෝගවල මිල අධික වීම

එළවළු සහ පළතුරු අස්වැන්න නෙළීම වර්ෂයක් තුළ නියමිත වූ කාලයනට සීමා වී තිබේ. එබැවින් ඉතිරි කාලවලදී සැපයුම ඉතාමත් අඩු වේ. තවද බලාපොරොත්තු රහිතව ඇතිවන අයහපත් කාලගුණික තත්ත්වයන් නිසා ඵලදාව අඩු වන අවස්ථාවන්ද ඇත. මෙවැනි හේතූන් නිසා වෙළෙඳ පොළේ එළවළු හා පළතුරු මිල බොහෝ විට ඉහළ මට්ටමක පවතී. නමුත් ඔබගේ ගෙවතු වගාව තුළ වසරේ විවිධ කාලවලට පලදාව නෙළාගත හැකි බෝග වවා තිබෙන්නේ නම් ඔබට මේ ගැටලුව ඇතිනොවේ.

### වෙළෙඳ පොළෙන් මිල දී ගන්නා බෝගවල කෘෂි රසායනික ද්‍රව්‍ය අඩංගු වී තිබීම

වානිජ්‍ය මට්ටමෙන් මහා පරිමාණිකව එළවළු හා පළතුරු වගා කිරීමේදී බහුල වශයෙන් රෝග හා පළිබෝධ හානි ඇති වේ. ඒවා මර්දනය කිරීම සඳහා කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිත කරනු ලැබේ. පළිබෝධනාශක මිනිසාට අධික ලෙස විෂ සහිත වන්නේය. ඒවා යෙදීමෙන් පසුව සාමාන්‍යයෙන් සති 2-3 කාලයක් ගතවන තෙක් අස්වැන්න නෙළගැනීම සුදුසු නොවන්නේය. නමුත් ඇතැම් ගොවීන් කෘෂි රසායනික ද්‍රව්‍ය යොදා සති 2 ක් ගතවීමටත් පෙර අස්වැන්න නෙළා වෙළෙඳ පොළට එවන අවස්ථාවන් ඇත. එසේම අයථා ලෙසින් කෘෂිරසායනික ද්‍රව්‍ය භාවිත කරන අවස්ථාවන් පිළිබඳවද වාර්තා වන්නේය.

ඒ අනුව වෙළෙඳ පොළේ ඇති එළවළු සහ පළතුරු බොහෝ විට අහිතකර කෘෂි රසායනික ද්‍රව්‍ය අඩංගු වී තිබීමට පුළුවන. නමුත් ඔබ ගෙවතු වගාවක් කිරීමේදී වඩාත් සුදුසු කාබනික පොහොර වර්ගය වන කොම්පෝස්ට් පොහොර යොදා ගැනීම හේතුවෙන් ඔබගේ පලදාව පරිභෝජනය කරන අයට හානියක් සිදුවන්නේ නැත.

### වෙළෙඳ පොළේ ඇති බෝගවල රසය හා ගුණය හීන වී තිබීම

අස්වැන්න නෙළාගත් අවස්ථාවේ සිට ගත වන කාලයත් සමග

විශේෂයෙන් එළවළු හා පළතුරුවල පෝෂණ ගුණය ක්‍රමයෙන් අඩු වේ. වෙළෙඳ පොළෙන් බොහෝ විට අපට මිලදී ගැනීමට සිදුවනුයේ අස්වැන්න නෙළා දින 3 - 6 ක් හෝ ඊට වැඩි කාලයක් ගත වූ රසයෙන් හා ගුණයෙන් හීන වූ එළවළු සහ පළතුරු ය.

නමුත් ඔබගේ ගෙවත්තෙන් නෙළාගෙන පරිභෝජනය කරනුයේ රසයෙන් හා ගුණයෙන් නොඅඩු බෝගයන් වන්නේය.

### පරිභෝජනයට නුසුදුසු එළවළු සහ පළතුරු මිල දී ගැනීමට සිදුවීම

බොහෝ එළවළු වර්ග නොමේරූ අවධියේදීත් පළතුරු වර්ග හොඳින් මේරූ පසුවත් නෙළා ගත යුතු වන්නේය. නමුත් පරිභෝජනයට කිසිසේත්ම නුසුදුසු තරමට මේරූ එළවළු වර්ග සහ නොමේරූ පළතුරු වර්ග වෙළෙඳ පොළේ තිබෙනු බොහෝ විට දකින්නට පුළුවන. මෙය මුලුමනින්ම පාරිභෝගිකයා රැවටීමකි.

එහෙත් ඔබ ගෙවත්තෙන් නෙළා ගනුයේ නියමිත ලෙසින් මේරූ එළවළු සහ පළතුරු වන බැවින් ඒවායේ පෝෂණය ඉතාමත් ඉහළ මට්ටමක පවතී.

මේ ආකාරයට වර්තමානයේදී ඉහළ මිල ගණන් වැය කරන අපි බොහෝ විට මිල දී ගනුයේ වස විස සපිරි, නැවුම් බවින් තොර, පෝෂණයෙන් හීන වූ එළවළු සහ පළතුරු ය. එබැවින් මෙවැනි ගැටලුවලින් මිදීමට නම් ඉඩ කඩ ඇති තරමින් ගෙවතු වගාවක් ආරම්භ කිරීම ඉතාමත් සුදුසු වන්නේය.

ගෙවතු වගාව ක්‍රමවත්ව පවත්වාගෙන යාම සම්බන්ධව තොරතුරු සමගින් මීළඟ සඟරාවෙන් ඔබ හමු වන්නෙමු.

**(ලිපි මාලාව සඳහා තොරතුරු සම්පාදනය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශිත 'ගෙවතු වගාව' සඟරාව ඇසුරිනි.)**

# මගේ වගාවට රසායනික පොහොර අහලකටවත් වද්දගන්නෙ නෑ




මිනිසුන් හැටියට උපන් අපගේ ජීවිතවලට සැබෑ වටිනාකමක් උරුම වන්නේ අප අපගේ ජීවිත ගතකරන ආකාරය අනුව ය. යම් කෙනකු තමන් ලැබූ ජීවිතය අර්ථවත්ව, ඵලදායකව ගතකිරීම තුළින් සමාජයට වැදගත් දායාදයන් තිළිණ කළ හැකි වන්නේ නම් ඔහු හෝ ඇය ජීවිතය ජයගත් අයෙකි. අදින් ඇරඹෙන 'ජීවිතය ජයගත් මිනිසුන්' විශේෂාංගය මගින් කතා කරන්නට මුලපුරනුයේ එවන් හරවත් චරිතයක් පිළිබඳව ය. අංක A37, බණ්ඩාරනායකපුර, රාජගිරිය ලිපිනයේ පදිංචි ඔහු සිය සිව්මහල් නිවසේ උඩුමහල කැප කර ඇත්තේ නිර්මාණාත්මක වගා ව්‍යාපෘතියක් වෙනුවෙනි. මෙය කියවන ඔබට ද ලැබෙන විවේකය ඵලදායකව වැය කරමින් ඔබට හිමි සීමිත ඉඩකඩකින් උපරිම ප්‍රයෝජන ලබමින් මෙවන් විනෝදාංශයක නියැළෙන්න බැරිකමක් නැත. මේ ඔහු ඔබට පවසන ඔහුගේ ආදර්ශවත් කතාව ය.

**ඔබගේ නම?**

කේ. ජී. ගුණපාල.

**වයස?**

අවුරුදු 60 යි.

**මෙවැනි නිර්මාණාත්මක වගාවක් ආරම්භ කරන්න අදහසක් ඇතිවුණේ කොහොමද?**

කොවිඩ්වලින් අපි ගෙවල්වලට කොටු වුණ කාලයේ මට හිතුණා නිකරුණේ කාලය නාස්ති නොකර මොකක් හරි ප්‍රයෝජනවත් දෙයක් කරන්න ඕන කියල. අපේ ගේ ඉස්සරහ හැදිල තිබුණ තක්කාලි පැළයකුයි වම්බටු පැළයකුයි. මං ඒවා ගලවගෙන ඇවිත් අපේ කොන්ක්‍රීට් වහලය උඩ හිටෙව්වා. ඒවා හොඳින් පැළ වුණා. ඉන්පස්සෙ උනන්දුවක් ඇතිවුණු මම ඕන කරන දේවල් ගෙනල්ලා ටිකෙන් ටික වැඩ පටන්ගත්තා. අද මගේ සාර්ථක වුණ ඒ වගාව උපරිම මට්ටමකට ඇවිල්ල තියෙනවා.

**වගා කර තිබෙන බෝග ගැන හැඳින්වීමක් කළොත්...**

නැති දෙයක් නැහැ කියන්න බැරි තරමට හැම දේම ටික ටික වවල තියෙනව කියල කියන්නෙ බොහොම සතුටින්. පළා වර්ග, එළවළු, පලතුරු බෝග වගා කර තියෙනවා.


23 පිටුවට



**වගා කර තිබෙන ඉඩ ප්‍රමාණය කොයිතරම්ද?**

පර්චස් 4.5 යි.

**යොදන පොහොර වර්ග මොනවාද?**

සම්පූර්ණයෙන්ම යොදන්නෙ කොම්පෝස්ට් පොහොර.

**ඔබගේ වගා බිම තුළම පොහොර නිපදවා ගන්නා බවකුත් පේනවා...**

ඔව්. වගාවෙන් ලැබෙන කොළ රොඩු, නිවසේ මස්, මාළු සෝදාගන්නා ජලය, පරෙවියන්ගෙ, කුකුළන්ගෙ මළපහ ඇතුළු ද්‍රව්‍ය කෝටුවලින් වට කරපු තැනක දිරන්න ඉඩහැරල තමයි කොම්පෝස්ට් පොහොර නිපදවාගන්නෙ. එහෙම නිපදවාගත්ත පොහොර මදි වුණොත් බත්තරමුල්ලෙ දියත උයනෙන් කොම්පෝස්ට් පොහොර මිලදී ගන්නවා.



**ඔබ කියන්නෙ මෙය මුලුමනින්ම කාබනික පොහොර මතම පදනම් වූ වගාවක් කියාද?**

ඇත්තෙන්ම ඔව්. මම මේ වගාව කරන්නෙ මූලිකවම මගේ ගෙදර අයගෙ පරිභෝජනය වෙනුවෙන්. ඒ හින්දා රසායනික පොහොර දාලා දැන දැනම මම මගේ දරුවන්ට වස විස කවන්නෙ නැහැනෙ.

**අතිරේක පලදාව අළෙවි කරනවාද?**

ඉස්සර මම ඉතිරි හරිය අහල පහල ගෙවල්වලට බෙදුවා. ඒත් නිෂ්පාදන වියදම ඉහළ යාමත් එක්ක එහෙම කරන්න අමාරුයි. ඒ නිසා ගෙදර පරිභෝජනයට අරගෙන ඉතිරි හරිය නිවස ඉදිරිපිට තියල අළෙවි කරනවා.

**ඔබ මේ කටයුත්ත කරන්නෙ රැකියාවක් කරන අතරවාරයේද?**

නැහැ. මම විශ්‍රාමිකයි. විශ්‍රාමික ජීවිතය පලදායක කරගෙන විනෝදාංශයක් හැටියටයි මම මේ වගාව කරන්නෙ.

**මේ කටයුත්තෙදි එල්ල වී ඇති ගැටලු මොනවද?**

පෝච්චි, කොම්පෝස්ට් පොහොරවල මිල අද දෙතුන් ගුණයකින් ඉහළ ගිහින්. ඒවා මිල දී ගන්න කවුරු හරි උදවු කරනව නම් බොහොම අගෙයි.



**හැමදාම වවන්නෙ එකම බෝග වර්ග ද?**

නැහැ. මේ බෝගවල අස්වැන්න සේරම නෙළාගත්තට පස්සෙ පෝච්චිවල පස් පිටට හලලා ඒකට වැලි සහ කොම්පෝස්ට් පොහොර මිශ්‍ර කරලා ඒ මිශ්‍රණය තද අව්වෙ හොඳට වේළනවා. ඒ මිශ්‍රණය බඳුන්වලට පුරවල තමයි අලුත් පැළ හිටවන්නෙ.

**ඔබේ මේ නිර්මාණාත්මක කටයුත්ත ඇගයීමට ලක්වී තිබෙනවාද?**

කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් යොමු කළ තරගයකින් බස්නාහිර පළාතෙන් 3 වැනි ස්ථානය මට හිමි වුණා. තව, බස්නාහිර පළාත් සභාව හා 'ශ්‍රද්ධා' මාධ්‍ය ජාලය එක් වී පැවැත්වූ 'දිරිය' වැඩසටහනේ අවසන් දහදෙනා (6 වැනි ස්ථානය) අතරට එන්නත් හැකියාව ලැබුණු බව කියන්නේ බොහොම සතුටින්. ඒ තරගයට මීට වඩා විශාල විදිහට ගෙවතු වගාව කරපු හුඟදෙනක් ඉදිරිපත් වුණා. ඒ අතරින් මගේ මේ පුංචි ගෙවත්ත ලබපු ජයග්‍රහණය මට ලොකු ආඩම්බරයක්.

සංවාද සටහන
**නලුන් අමන්ද**

සුවසෙත

## නොදැන වීසි කරන ගුණ බොහෝ ළපු

# කරපිංචා



ව්‍යංජන රසවත් කරන රසකාරක ලැයිස්තුවේ ඉහළින්ම කියවෙන නමක් වන්නේ කරපිංචා ය. ශ්‍රී ලංකාවේ වියළි කලාපීය ප්‍රදේශවල බහුල වශයෙන් වැවෙන මේ ශාකය කිසිදු පොහොර හෝ කෘමිනාශක යෙදීමෙන් තොරව ස්වාභාවිකව වැඩෙන ශාකයකි. මේවායේ මුල් මගින් නව ශාක ඇති වේ.

කරපිංචා සතු ඖෂධීය ගුණ රැසකි. නමුත් ඒ පිළිබඳ බොහෝ දෙනකු තුළ අවබෝධයක් නොමැති වීම කනගාටුවට කරුණකි.

කරපිංචා කොළ කැඳ උදෑසන හිස් බඩ පානය කිරීමෙන් දෝෂ රැසක් දුරු කරගත හැකි ය. සර්ප විෂ ශරීරගත වූ විට මෙම කැඳ හීනටි සහල් සමග පිස ලුණු මිශ්‍ර නොකර පානය කාරීමෙන් සර්ප විෂ සමනය වේ. මෙසේ පානය කිරීම සෙංගමාල රෝගයට ද ගුණදායක ය.



සර්පයින් දෂ්ට කළ තැන්වල කරපිංචා කොළ, පොතු, මුල්, අමු කහ, ලුණු සමග කොටා බැඳීමෙන් ඉක්මන් සුවයක් ලැබේ.

කරපිංචා කොළ කැඳ දිනපතා පානය කිරීම නිසා රුධිරගත කොලෙස්ටරෝල් ප්‍රමාණය අඩු වන බව ආයුර්වේද වෛද්‍ය විද්‍යාත්මක මතය වේ. මේ බව බටහිර වෛද්‍ය විද්‍යාත්මක පර්යේෂණ මගින් ද තහවුරු වී තිබේ.

සිරුරට ඇතුළු වන වස විස නැසීමේ ද දියවැඩියා රෝගීන්ගේ රුධිරගත ග්ලූකෝස් ප්‍රමාණය පාලනය කිරීමේ ද හැකියාවක් කරපිංචා සතු ය.

සමේ රෝග සමනය වීමට බොහෝ දුරට හේතු වන කරපිංචා කොළවල යුෂ පිළිස්සුම් සහ කෘමි දෂ්ඨවලින් ඉක්මන් සුවය ලැබීමට හේතු වේ.

වඩාත් සුදුසු වන්නේ කරපිංචා කොළ අමුවෙන් ආහාරයට ගැනීම ය. කරපිංචා කොළවලින් පිළියෙළ කරගත් සම්බෝලය සිරුරට ඉතා ගුණදායක වේ.

ස්නායු දුර්වල වීම, අර්ශස්, කල් ගිය හිසරදය සුවයට කරපිංචා දිව ඔසුවකි.

කරපිංචා කොළවල අඩංගු ෆීනෝල් වැනි රසායනික සංඝටක මගින් පුරස්ථ ග්‍රන්ථියේ සහ මහා බඩවැලේ ඇතිවන පිළිකා පාලනයට හේතු වන්නේ ය. කරපිංචා කොළවල අඩංගු විටමින් ඒ මගින් ඇස් පෙනීම වර්ධනය කරවයි, ඇට මිදුළු ආරක්ෂා කරයි.

කරපිංචා කොළ කොටා යෝගට් සමග මිශ්‍ර කර හිසේ ගැල්වීමෙන් හිස්සොරි දුරු වේ, හිස කෙස්වල කළු වර්ණය රඳවාගත හැකි වේ.

කරපිංචා සතු මෙකී නොකී ගුණ රැස ගැන නොදන්නා අප ආහාර අනුභවයේදී එය පිඟානේ පසෙක තබා ඉඳුල් සමග ඉවත හෙළයි. ගෘහිනියනි, කරපිංචාවලින් ලැබෙන සැබෑ ගුණය, සැබෑ රැකවරණය ඔබගේ පවුලට නිසි ලෙස උරුම කරවන්නට නම් කරපිංචා කොළ සිහින්ව ලියා ආහාරයට මුසුකිරීම නුවණට හුරු වන්නේ ය.

නිර්මාණී කොඩිකාර

සුවසෙත

# හෘදයාබාධ ගැන දැනගනිමු



**'පපුවේ අමාරුව', 'හාට් ඇටෑක්' ලෙසින් කොයි තවුරුත් දන්නා තරමක් බැරෑරුම් ලෙසින් කිවහොත් 'හෘදයාබාධ' ලෙසින් හඳුන්වන රෝගයට අද ගොදුරු වන තරුණ හා මැදි වයස් කාණ්ඩවල පසුවන්නන්ගේ ප්‍රමාණය ඉතාමත් ඉහළ මට්ටමකට පත්ව තිබේ. මෙය ඉතාමත් කනගාටුදායක තත්ත්වයකි. මන්ද මෙය මරණයෙන් කෙළවර වීමේ වැඩි ඉඩ කඩක් ඇති රෝගයක් නිසා ය. මේ අවදානම් තත්ත්වය සැලකිල්ලට ගෙන හෘදයාබාධ පිළිබඳ සරල, සවිස්තරාත්මක ලිපි පෙළක් 'ශ්‍රී පුර' පාඨක ඔබ වෙත මෙම කලාපයේ පටන් ඉදිරිපත් කිරීමට තීරණය කළෙමු.**

### මිනිස් හෘදය



ශරීරයේ උරස් කුහරය තුළ පෙනහලුවලට මැදිව වම් පැත්තට බරව හෘදය පිහිටයි. යමකු අත විට මෙළවූ විට ලැබෙන පරිමාවට ඔහුගේ හෝ ඇයගේ හෘදයේ විශාලත්වය සමාන වන බව කියවේ. හෘදය පේශිවලින් නිර්මාණය වූ, නොකඩවාම සංකෝචනය වෙමින් හා ඉහිල් වෙමින් පවතින ඕවලාකාර හැඩැති මල්ලක් වැනි ඉන්ද්‍රියයකි.

වැඩිහිටි පිරිමියකුගේ හෘදය දළ වශයෙන් ග්‍රෑම් 280 - 340 දක්වා ද කාන්තාවකගේ හෘදය දළ වශයෙන් ග්‍රෑම් 230 - 280 දක්වා ද බරින් යුක්ත වන බව සොයාගෙන තිබේ. මිනිත්තුවක් තුළදී හෘදයෙන් පිටවන රුධිර ප්‍රමාණය මිලිලීටර 5040 ක් පමණ වේ.



හෘදයේ ප්‍රධාන කාර්යයන් වන්නේ රුධිර සංසරණ පද්ධතිය හරහා ශරීරය පුරා රුධිරය පොම්ප කිරීම මගින් පටකවලට ඔක්සිජන් වායුව සහ පෝෂ්‍ය පදාර්ථ සැපයීම හා කාබන්ඩයොක්සයිඩ් වායුව ඇතුළු අනෙක් අපද්‍රව්‍ය සිරුරෙන් ඉවත් කිරීමට දායක වීම ය.

ශරීරයේ පටක සක්‍රිය තත්ත්වයෙන් පැවතීමට නිරන්තරයෙන් පෝෂ්‍ය ද්‍රව්‍ය ලැබීම අත්‍යවශ්‍ය වේ. පටකවලට (සෛල එක් වී පටක නිර්මාණය වේ) රුධිරය සැපයීම අඩාල වුවහොත් නිසැකවම මරණය සිදුවේ.

හෘදයෙන් ඉවතට රුධිරය ගෙන යන නාළ 'ධමනි' ලෙසත් හෘදය වෙත රුධිරය රැගෙන එන නාළ 'ශිරා' ලෙසත් හැඳින්වේ. පටක එක් වී නිර්මාණය වී ඇති පේශිවලින් සමන්විත වී තිබෙන හෘදයේ පැවැත්මට ද රුධිරය අත්‍යවශ්‍ය වේ.

### හෘදයාබාධ යනු

හෘදයට රුධිරය සපයන ප්‍රධාන නාළ 'කිරීටක ධමනි' ලෙසින් හැඳින්වේ. මේවායේ මේදමය සංයෝගයක් වන කොලෙස්ටරෝල් තැන්පත් වන්නට පුළුවන. එලෙස කිරීටක ධමනියේ එක් තැනක් හෝ තැන් කිහිපයක් කොලෙස්ටරෝල් තැන්පත් වීම නිසා අවහිර වුවහොත් හෘදයට රුධිරය සැපයීම අවහිර වී හෘදයේ ක්‍රියාකාරීත්වය අඩපණ වේ.

හෘදයාබාධවලට බලපාන හේතු කිහිපයක් ඇත. ඒ අතරින් ප්‍රධාන වන්නේ මෙකී ආකාරයේ ධමනි අවහිර වීම් ය. තවද කිරීටක ධමනිවල රුධිර කැටි ඇති වී හෘදය වෙත රුධිර ගමනාගමනය අවහිර වීම හේතුවෙන් ද හෘදයාබාධ වැළඳේ.

වෛද්‍ය වාර්තා සහ පොත පත ඇසුරිනි
**සුනෙත් ජයකොඩි**

පිළිසඳර



**අපරාජිත නාලන්දා ක්‍රිකට් කණ්ඩායම [1957]**



# විනය නීති කඩකරන ඕනෑම ක්‍රීඩකයෙක් ජාතික ක්‍රිකට් කණ්ඩායමෙන් අනිවාර්යයෙන්ම ඉවත් කළයුතුයි



### ශ්‍රී ලංකා ක්‍රිකට් පිටියේ රන් ස්වරය

## ප්‍රේමසර ඇපාසිංහ

**ප්‍රවීණ ක්‍රිකට් විස්තර ප්‍රචාරක හා මාධ්‍යවේදී**

ක්‍රිකට් ප්‍රචලිතව ඇත්තේ 'සුද්දන්ගේ ක්‍රීඩාව' ලෙසිනි. මුල් කාලයේදී මේ ක්‍රීඩාවේ නිරත වූයේත් මේ ක්‍රීඩාව ගැන උනන්දු වූයේත් ඉංග්‍රීසි උගත් මෙරට ප්‍රභූ පන්තියේ වැජඹුණු සීමිත පිරිසක් පමණයි. ඔවුන්ගේ අවශ්‍යතා සපිරෙන අයුරින් එවකට මේ ක්‍රීඩාවේ විස්තර කථනයන් (Commentary) ගුවන්විදුලිය ඔස්සේ ප්‍රචාරය කෙරුණේත් ඉංග්‍රීසි බසින්ම ය. එබැවින් සිංහල බස පමණක් දැන උගත් ශ්‍රී ලාංකික ක්‍රිකට් ලෝලීන්හට මේ ක්‍රීඩාව හා සම්බන්ධ වීමේ මගක් එකල තිබුණේ නැත. මෙබඳු වාතාවරණයක් තුළ මේ ක්‍රීඩාවේ විස්තර ප්‍රචාරයන් තියුණු, පැහැදිළි හඬකින්, ව්‍යක්ත වාග් විලාසයකින් සිංහල බසින් අප වෙත ගෙන ඒමේ පුරෝගාමියකු ලෙසින් ජ්‍යේෂ්ඨ මාධ්‍යවේදියකු වන ප්‍රේමසර ඇපාසිංහයන් හැඳින්විය හැකි ය. සිංහල බසින් පමණක් නොව ඉංග්‍රීසි බසින් ද චතුර ලෙස ක්‍රිකට් විස්තර ප්‍රචාරයන් ඉදිරිපත් කිරීමේ මනා කුසලතාවක් ඔහු සතු ය. මෙරට තුළ ක්‍රීඩා සාහිත්‍යයක් ගොඩනැංවීමෙහිලා පුරෝගාමී මෙහෙවරක නිරත වන හෙතෙම, 'ශ්‍රී පුර' මෙම කලාපයෙන් ඇරඹෙන 'පිළිසඳර' විශේෂාංගයේ ආරම්භක පියවරෙන් ඔබ වෙත කැඳවාගෙන එන්නට අපි තීරණය කළෙමු.



27 පිටුවට

## කුඩා අවධියේදී



**අපි සුන්දර ළමා වියෙන් කතාව අරඹමු.**

උපන් දිනය 1937 ඔක්තෝබර් 05 වැනිදා. මං උපන්නෙ කොළඹ ලංකා විශ්වවිද්‍යාල කොලීජියෙ. පියාණන් වහන්සේ කොළඹ විශ්වවිද්‍යාල කොලීජියේ අනධ්‍යයන කාර්ය මණ්ඩලය භාර නිලධාරියා ලෙස වගකිව යුතු සේවයක් ඉටුකළා. කලින් ඔහු ගුරුවරයෙක්. මෑණියන් වහන්සේත් ගුරුවරියක්. මං මුලින්ම ඉගෙනගත්තෙ කොළඹ විශාකා බාලිකා විද්‍යාලයෙ. පසුව කොළඹ නාලන්දා විද්‍යාලයට යොමු කෙරුණා.

**ළමා වියේ පටන්ම ක්‍රිකට් ක්‍රීඩාවට හිත ගියේ කොහොමද?**

මම පවුලෙ එකම දරුවා. ගෙදර සෙල්ලම් කරන්න කෙනෙක් හිටියෙ නෑ. මම කරන්නෙ කොළඹ විශ්වවිද්‍යාල කොලීජියේ ක්‍රිකට් ක්‍රීඩා පිටියෙ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් ක්‍රිකට් ක්‍රීඩා හා මලල ක්‍රීඩා කරන හැටි බලා සිටීම. ඒ දකින මම ගෙදර ඇවිත් කළේ ටෙනිස් බෝලෙ බිත්තියට ගහල ඒ වැදිල එන බෝලෙට බැට් එකෙන් ගහන එකයි. ඔයින් මෙයින් මගේ පුංචි හිත ටිකෙන් ටික ක්‍රිකට්වලට ඇදිල ගියා.

**නාලන්දා විද්‍යාලයෙන් ජීවිතයට ලැබුණු පන්නරය?**

නාලන්දාව තමයි මගේ ජීවිතයෙ හැරවුම් ලක්ෂ්‍යය. එතැනින් මට ලැබුණෙ පොත පතේ දැනුම විතරක්ම නෙවෙයි. සමාජයේ විනයගරුක යහපත් පුරවැසියෙක් විදිහට ජීවත් වෙන්නත් මේ විද්‍යාලයෙන් ලැබුණෙ ලොකු මගපෙන්වීමක්. රිජ්වේ තිලකරත්න (හිටපු ප්‍රවීණ පරිපාලන නිලධාරියෙක් හා ගුවන්විදුලි සංස්ථාවේ හිටපු සභාපතිවරයෙක්), කේ. එම්. පී. රාජරත්න (හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්), සුගතමුනි ඥානසිරි (ප්‍රවීණ ලේඛකයෙක්) මගේ ජීවිතයට දැවැන්ත ආලෝකයක් වුණු ගුරුමහත්වරුන් කිහිප දෙනෙක්.

**ඔබ ක්‍රිකට් ක්‍රීඩාවට අත්පොත් තබන්නෙත් නාලන්දාවෙන්මයි...**

ඔව්. මුලින්ම මට ක්‍රිකට් ක්‍රීඩකයෙක් හැටියට දස්කම් පෙන්වන්න පුළුවන් වුණේ 1956 දි නාලන්දාවෙ පැවැත්වුණු නිවාසාන්තර මලල ක්‍රීඩා උත්සවයේ එක් අංගයක් වුණු ක්‍රිකට් තරගයකදියි. ඒ වෙද්දි මං ඉගෙන ගනිමින් සිටියෙ විශ්වවිද්‍යාල ප්‍රවේශ පන්තියෙ. මම මේ තරගයට ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් වුණා. ප්‍රතිවිරුද්ධ පිලේ සිටියෙ එසේ මෙසේ දක්ෂයො නෙවෙයි. මේ තරගයේ ආරම්භක පන්දු යවන්නන් දෙදෙනා තමයි එවකට නාලන්දාවේ ජ්‍යේෂ්ඨ ක්‍රිකට් කණ්ඩායමේ ආරම්භක පන්දු යවන්නන් වුණේත්. මට එල්ල වුණු මුල්ම පන්දු 3 ටම හතරෙ පහරවල් එල්ල කළා. මගේ මුළු ලකුණු ගණන 79 ක් (නොදැවී). අපේ නායකයා ලකුණු 0 යි. මම විකට් රැකීමත් හොඳින් කළා. මේ දක්ෂකම නිසා නාලන්දාවෙ ජ්‍යේෂ්ඨ ක්‍රිකට් කණ්ඩායමට මාව තෝරාගැනුණා. මාව තෝරා ගත්තේ නාලන්දාවේ ක්‍රිකට් භාර ගුරුතුමා වූ ටී. කන්දස්වාමි මහතායි.

## ක්‍රිකට් තරගාවලියක උද්වේගකර අවස්ථාවක්



**සිංහල ක්‍රිකට් ක්‍රීඩා ලෝලීන්ට ක්‍රිකට් ක්‍රීඩාව සමීප කරමින් ක්‍රිකට් ක්‍රීඩා විස්තර ප්‍රචාරකයකු ලෙසින් ඔබ ඉටුකළ මෙහෙවර සදානුස්මරණීයයි. ඒ ක්ෂේත්‍රයට ඔබ පිවිසුණේ කොහොමද?**

මගේ ක්‍රිකට් විස්තර ප්‍රචාරක දිවියේ ආරම්භක අවස්ථාව ලෙස 1969 දී පී. සරවනමුත්තු ක්‍රීඩාංගනයේදී පැවැත්වුණු රාජකීය - සාන්ත තෝමස් විද්‍යාලයාන්තර මහා ක්‍රිකට් තරගයේ විස්තර ප්‍රචාරකයෙක් ලෙස කටයුතු කළ අවස්ථාව සිහිපත් කරන්න පුළුවන්. ඒ සඳහා අවස්ථාව උදාවුණේ එවකට ගුවන් විදුලියේ වෙළෙඳ සේවයේ අධ්‍යක්ෂ ලිවී විජේමාන්න මහතා නිසයි.

ගුවන් විදුලි නිවේදකයෙක් ලෙස මට ගුවන් විදුලියට සම්බන්ධ වීමේ අවස්ථාව සලසා දුන්නේ ගුණරත්න අබේසේකරයන් (කරුණාරත්න අබේසේකරයන්ගේ සොයුරු). එකල ගුවන් විදුලියේ 'සන්ධ්‍යා සේවය' නමින් වැඩසටහනක් ප්‍රචාරය වුණා. එහි අධ්‍යක්ෂිකාව වුණේ ප්‍රවීණ නිවේදිකා නන්දා ජයමාන්න මහත්මියයි. ගුණරත්න අබේසේකරයන්ගේ ඉල්ලීම පරිදි ඇය මට ඇරයුම් කළා ගුවන් විදුලියෙන් මිනිත්තු 15 ක ක්‍රීඩා

විස්තර සමාලෝචනයක් ගෙන එන ලෙස. මම ගුවන් විදුලියට සම්බන්ධ වුණේ ඒ ආකාරයටයි.

ක්‍රිකට් විස්තර ප්‍රචාරයේදී මුල් කාලයේදී ප්‍රවීණ ක්‍රිකට් විස්තර ප්‍රචාරක පාලිත පෙරේරා, තිලක සුධර්මන්, අමරබන්දු රූපසිංහ යන අය සමගයි මම කටයුතු කළේ. 1982 සිට රූපවාහිනිය මගින් සිංහල ක්‍රිකට් විස්තර ප්‍රචාරකයෙක් විදිහට කටයුතු කරන්න මට අවස්ථාව සැලසීමත් විශේෂ කරුණක්.

**ක්‍රිකට් විස්තර ප්‍රචාරක දිවියේ අමතක නොවන අත්දැකීම?**

අදටත් සන්තෝෂයි 1996 වසරේ මාර්තු 17 වැනි දින පාකිස්ථානයේ ලාහෝර්හි ගඩාෆි ක්‍රීඩාංගණයේදී ඔස්ට්‍රේලියානු කණ්ඩායම හා තරග වැදී ශ්‍රී ලංකා කණ්ඩායම ක්‍රිකට් ලෝක කුසලානය දිනාගත් ඒ අසිරිමත් මොහොත මගේ කටහඬින් වාර්තා කරන්නට ලැබීම ක්‍රිකට් විස්තර ප්‍රචාරක දිවියේදී මා ලැබූ විශාලතම භාග්‍යයයි.

**වර්තමානයේ අපේ ක්‍රිකට් කණ්ඩායමේ අසාර්ථකත්වය ගැන විවිධ චෝදනා එල්ල වෙනවා. අපේ ක්‍රිකට් කණ්ඩායම සාර්ථකත්වය කරා යොමු කරවන්න ඔබ ඉදිරිපත් කරන යෝජනා මොනවාද?**

අපේ කණ්ඩායමෙන් ප්‍රවීණයන් ඉවත් වෙද්දි නවකයින් එක්විය යුතුයි. මේ සඳහා පාසල් ක්‍රිකට් ක්‍රීඩාව වඩාත් හොඳින් දියුණු කිරීම අනිවාර්යයි.

'සියල්ලට පෙර මගේ රට' කියන අදහස අපේ ජාතික ක්‍රිකට් කණ්ඩායමේ සෑම ක්‍රීඩකයකු තුළම තිබිය යුතු ආකල්පයක්. ඔවුන් ක්‍රීඩා කරන්නෙ තමන්ට කීර්තිය දිනාගන්න පමණක් නෙවෙයි, රටට කීර්තිය උදාකර දීම වෙනුවෙන්.

යහපත් ආදර්ශවත් නායකත්වය අත්‍යවශ්‍ය දෙයක්. ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමේ මා දුටු හොඳම නායකයා අර්ජුන රණතුංග. ඔහු කණ්ඩායම වෙනුවෙන් නිර්භීතව ඉදිරිපත් වුණා. ක්‍රීඩකයින්ගෙ විනය ගැන දැඩිව සැලකිලිමත් වුණා. කණ්ඩායමක යහපැවැත්මට විනය අත්‍යවශ්‍ය දෙයක්. මගේ පෞද්ගලික මතය තමයි විනය කඩකළ ක්‍රීඩකයින්ව අනිවාර්යයෙන්ම කණ්ඩායමෙන් ඉවත් කළ යුතුමයි.

**ශ්‍රී ලාංකේය ජන සමාජය තුළ ක්‍රිකට් ක්‍රීඩාව ප්‍රචලිත කිරීම වෙනුවෙන් ඔබ ඇගයීමට ලක් වූ අවස්ථාවන් කිහිපයක් සිහිපත් කළොත්...**

1975 දී කෝට්ටේ කල්‍යාණී සාමග්‍රී ධර්ම මහා සංඝ සභාව මා වෙත 'සන්නිවේදනසූරි ධර්මප්‍රිය' ගෞරව නාමය පිරිනැමුවා.

1998 දී ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක මණ්ඩලය මගින් කොළඹ හිල්ටන් හෝටලයේදී ක්‍රිකට් ක්‍රීඩකයින්ට, ඒ හා සම්බන්ධ පරිපාලකයින්ට, මාධ්‍යවේදීන්ට සම්මාන පිරිනැමුණා. මමත් ඉන් කෙනෙක්. මහනුවර ධර්මරාජ, ගාල්ලේ මහින්ද, කොළඹ ආනන්ද විද්‍යාලවලින් ද මගේ සේවය ඇගයීමට ලක්වුණා. නීතිඥ චන්ද්‍රා සිල්වා මහතා කෝට්ටේ නගරාධිපතිවරයා ලෙස කටයුතු කළ අවධියේදී පැවැත්වූ 'සහශ්‍ර ප්‍රණාම' උපහාර උළෙලේදී සුවිශේෂ මෙහෙවරක නිරත වූ කෝට්ටේ මහ නගර සභා බල ප්‍රදේශය තුළ ජීවත්වන සම්භාවනීය පුද්ගලයින්ට සම්මාන පිරිනැමුවා. එහිදීත් මම උපහාර ලැබුවා.

ක්‍රිකට් ක්‍රීඩාවේ රන් ස්වරය කෘතිය
නාගරික කොමසාරිස්තුමියට පිළිගන්වමින්



**ඔබ පුවත්පත් මාධ්‍යවේදියකු වශයෙන් ද කීර්තිමත් මෙහෙවරක් කළ අයෙක්. ඒ පිළිබඳ මතකය අවදි කළොත්...**

1967 ඔක්තෝබර් 17 මගේ පුවත්පත් කලා ජීවිතයේ අමතක නොවන දවසක්. ඒ වෙද්දි මම සීගිරි මහා විද්‍යාලයේ ගුරුවරයෙක් විදිහට සේවය කරමින් සිටියා. එදා යම්කිසි කෙනෙක් සීගිරි බිතු සිතුවම් කිහිපයක තීන්ත ගල්වා කර තිබුණෙ මහා විනාශයක්. මේ සිදුවීම මම යුහුසුළුව ලේක්හවුස් පුවත්පත්වලට වාර්තා කළා. මේ සිදුවීම මෙරට පුවත්පතකට වාර්තා කළ මුල්ම මාධ්‍යවේදියා වුණේ මම. සීගිරිය කියන්නෙ මගේ ඉතාමත් සිත්ගත් තැනක්. මගේ දුවටත් මම නම තිබ්බෙ 'අප්සරා' කියලයි.

**මෑතකදි ඔබ පිළිබඳ ලියවුණු පොතක් පිටවුණා. ඒ ගැනත් කතා කරමු.**


මේ පොතෙන් කියවෙන්නෙ මගේ ජීවිත කතාව. පොතේ කතුවරයා අතුල රංජිත් වෙදමේස්ත්‍රිගේ. ඔහු මා උගත් නාලන්දා විද්‍යාලයේම ආදි ශිෂ්‍යයෙක්. ඒ වගේම මාධ්‍යවේදියෙක්. පොතේ නම 'ශ්‍රී ලංකා ක්‍රිකට් පිටියේ රන් ස්වරය - ප්‍රේමසර ඈපාසිංහ' (GOLDEN VOICE OF CRICKET IN SRI LANKA PREMASARA EPASINGHE)'

**සංවාද සටහන**
**නදුන් අමන්ද මනමේන්ද්‍ර ආරච්චි**

නව ලොව නිපැයුම්

# හයිඩ්‍රජන් වායුව ලෝහයක් බවට පත්කළ ශ්‍රී ලාංකේය විස්මකර්මයා

HYDROGEN




මෙතෙක් කලක් අප දැන සිටියේ හයිඩ්‍රජන් යනු වායුවක් ලෙසිනි. එය මුල් වරට සොයාගනු ලැබුවේ ප්‍රංස ජාතික විද්‍යාඥ හෙන්රි කැවෙන්ඩිෂ් විසිනි. එහෙත් මේ වන විට හයිඩ්‍රජන් වායුව ලෝහයක් බවට පත්කිරීමේ හැකියාව ලැබී තිබේ.

මේ ඓතිහාසික කාර්යයට මුල් වූයේ ශ්‍රී ලාංකික විද්‍යාඥයෙකි. ඒ, රංග ප්‍රභාෂ්වර ඩයස් ය. හේ ඇමරිකා එක්සත් ජනපදයේ රෝචෙස්ටර් විශ්වවිද්‍යාලයේ සහායක මහාචාර්යවරයෙකි. හයිඩ්‍රජන් වායුව ලෝහයක් බවට පත්කිරීමේ කාර්යය පිළිබඳ වසර 45 ක් පුරා පර්යේෂණවල නිරතව සිටින ඇමරිකා එක්සත් ජනපදයේ හාවර්ඩ් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය අයිසැක් සිල්වේරාගේ මගපෙන්වීම යටතේ ඔහු මෙකී සොයාගැනීමේ නිරත විය.

හයිඩ්‍රජන් වායුව ලෝහයක් බවට පත්කළ හැකි බව මෙයින් වසර 80 කට පමණ ඉහතදී පවා විද්‍යාඥයින් තුළ අවබෝධයක් තිබුණද එය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවුණු මුල්ම අවස්ථාව මෙය විය.

දියමන්ති යොදාගෙන හයිඩ්‍රජන් මවුලවලට ඉතා ඉහළ පීඩනයක් ලබා දී හයිඩ්‍රජන් වායුවේ **($H_2$)** මවුල අතර පවතින පරතරය අඩු කර එහි පරමාණු දෙක එකිනෙකින් වෙන් කර **(H** බවට පත්කර**)** ලෝහයක් බවට පත්කිරීම මෙහිදී සිදුකෙරිණි.

අධික පීඩනයක් යටතේ මූලද්‍රව්‍ය හැසිරෙන්නේ කෙසේදැයි යන්න සම්බන්ධව කොළඹ විශ්වවිද්‍යාලයේදී ස්වකීය ආචාර්ය උපාධිය හැදෑරූ හෙතෙම, මහාචාර්ය සිල්වේරාගේ පර්යේෂණය හා සම්බන්ධ වී තිබෙනුයේ මීට වසර 3 කට පමණ ඉහතදී ය.

**හයිඩ්‍රජන් වායුව ලෝහයක් බවට පත්කිරීමෙන් අත් වී ඇති වාසි රැසකි. මේ ඉන් කිහිපයකි.**

*** බලශක්තිය නිපදවීම සඳහා වැය වන වියදම අවම වීම**

*** හයිඩ්‍රජන් වායුව තුළ බලශක්තිය තැන්පත් කළ හැකි වීම**

*** ඉන්ධනයක් ලෙසින් භාවිත කළ හැකි වීම**

*** අභ්‍යවකාශ යානා නිපදවීම සඳහා හයිඩ්‍රජන් ලෝහය යොදාගත හැකි වීම**

*** අධිවේගී දුම්රිය අඩු වියදමකින් නිෂ්පාදනය කළ හැකි වීම**

*** ඉලෙක්ට්‍රොනික පරිපථ නිපදවීම සඳහා යොදාගත හැකි වීම**

“උදාහරණයක් ලෙස විදුලි බලය සම්ප්‍රේෂණයේදී ප්‍රතිරෝධය (විදුලිය ගමන් කිරීමට එරෙහිව ඇතිවන බාධකය) නිසා විශාල හානියක් සිදුවෙනවා. නමුත් ලෝහමය හයිඩ්‍රජන් පාවිච්චි කරලා වයර් හදන්න පුළුවන් වුණොත් අපිට පුළුවන් කිසිම හානියක් නැතුව විදුලිය යැවීමෙන් බලශක්තිය ඉතිරි කරගන්න පුළුවන් වෙයි.” මහාචාර්ය රංග ප්‍රභාෂ්වර ඩයස් පවසන්නේය.

**සුනෙත් ජයකොඩි**



# ආයතනයේ තේ හදන සේවකයා කියා දුන් අමතක නොවන පාඩම



ජපානයේ එක්තරා සබන් කර්මාන්ත ශාලාවකි. එහි අමුද්‍රව්‍ය, අඹරන යන්ත්‍රයට දැමූ විට ඒවා ඇඹරී සබන් කැට සෑදී බෙල්ට් එකක් දිගේ පැමිණේ. හිස් සබන් පෙට්ටිවලට සබන් කැටය වැටෙන පරිදි 'ටයිමින්' සකස් කර ඇත. ඉන්පසුව ස්වයංක්‍රියව සබන් පෙට්ටි 'සීල්' වන අතර ඒවා සබන් කැට 100 ක් වන පරිදි කුඩා පෙට්ටිවලට ඇසිරේ. එම පෙට්ටි අළෙවි අංශයෙන් ජපානය පුරා බෙදා හැරේ.

ටික කලකින් අළෙවි අංශයට පැමිණිල්ලක් එල්ල විය. සබන් කැට 100 ක ලොකු පෙට්ටියක සබන් කැට නොමැති හිස් පෙට්ටි 10 - 15 ක් පවතින බව ඉන් කියවිණි.

මෙම ගැටලුව ඇති වූයේ හිස් සබන් පෙට්ටි පැමිණෙන වේගය හා ඊට අනුරූපව සබන් කැටය එම පෙට්ටියට වැටෙන වේගය මිලි තත්පර ගණනකින් වෙනස් වීම නිසාය. සරලව කිවහොත් 'ටයිමින්' අවුලක් නිසාය. කර්මාන්ත ශාලාවේ තාක්ෂණික අංශයට මෙය විසඳිය නොහැකි විය. පිටතින් ගෙන්වා ගත් විශේෂඥ කණ්ඩායම්වලටද විසඳුම් සෙවීමට හැකියාවක් නොවීය. විදෙස් රටවලින් ගෙන්වා ගත් අයටද විසඳුමක් සොයාගැනීමට පුළුවන්කමක් තිබුණේ නැත.

කර්මාන්ත ශාලා හිමිකරු අසරණ වී සිටියේය. බැරිම තැන ඔහු කර්මාන්ත ශාලාවේ සියලු සේවකයින්ගේ රැස්වීමක් කැඳවා ඔවුන් සියලු දෙනාගේ අදහස් විමසා සිටියේය. ඔවුන් අදහස් ලබා දුන් අතර ඒවා සියල්ල කලින් කවුරුන් විසින් හෝ ඉදිරිපත් කරන ලද අසාර්ථක වූ ඒවා විය. අයිතිකරු තවත් අසරණ විය.

මේ අතර තේ පැන් පිළියෙළ කර පිළිගැන්වීමේ වාරය උදා විය. රැස්වීමට සහභාගී නොවූ එකම සේවකයා තේ පැන් පිළිගන්වන සුළු සේවකයා අයිතිකරු අමතා එකී තාක්ෂණික ගැටලුව ඔහුට විසඳිය හැකි බව පැවසීය. අයිතිකරු මුලදී කෝපයට පත් විය. ලොව පුරා විශේෂඥයින් වෙනුවෙන් කෝටි ගණන් වියදම් කර විසඳිය නොහැකි වූ ගැටලුව මෙම සුළු සේවකයා විසඳන්නේ කෙසේදැයි අයිතිකරුට සිතෙන්නට ඇත.

කෙසේ වෙතත් වෙන කළ හැකි යමක් නොමැති නිසා අයිතිකරු සුළු සේවකයාගෙන් විමසා සිටියේ, "ඔබට මේ ගැටලුව විසඳා දීමට යෙන් මිලියන කීයක් ඕනෑද?" යනුවෙන් පමණි. සේවකයා එය අසා සිට පැවසුවේ " මට ඩොලර් මිලියන ගණන් ඕන නෑ. ඕන වෙන්නෙ හොඳ ස්ටෑන්ඩ් ෆෑන් එකක් විතරයි." යනුවෙනි.

පුදුමයට පත් වූ අයිතිකරු උපහාසයෙන් සිනාසී හොඳ විදුලි පංකාවක් ගෙන්වා දුන්නේය. සුළු සේවකයා එය රැගෙන ගොස් එයට විදුලිය සම්බන්ධ කර සබන් කැට වැටී බෙල්ට් එක දිගේ එන සබන් පෙට්ටි දෙසට එය යොමු කළේය.




සබන් කැට නොවැටී පැමිණෙන හිස් සබන් පෙට්ටි විදුලි පංකාවේ සුළඟින් වීසි වී ගියේය. වසර ගණනාවක් විසඳිය නොහැකි ගැටලුව විසඳිණි. වැය වූයේ යෙන් තුන්දහසක්ටත් වඩා අඩු මුදලක් වටිනා විදුලි පංකාවක් පමණි.

**ආදර්ශයඃ ඔබ හොඳ ව්‍යවසායකයකු නම් හොඳ ඇහුම්කන් දෙන්නකු විය යුතුය. නොසිතන පුද්ගලයන්ගෙන් ඔබට මිල කළ නොහැකි ප්‍රයෝජන ගත හැකි වන්නේ එවිට ය. කිසි විටක කිසිවකු අවතක්සේරු නොකරන්න. එවිට ඔබ සාර්ථක ව්‍යවසායකයකු වනු ඇත.**

උපුටා ගැනීම මුහුණුපොතෙනි



කෙටි කතාව

# විඳවන්නද මේ භවය පුරා

එල්. ලෂිණි සංසලා පෙරේරා (කෝ/ජනාධිපති බාලිකා විද්‍යාලය)

**කෝට්ටේ මහජන පුස්තකාල සාමාජික සාමාජිකාවන් අතර මේ වසරේ පැවැති සාහිත්‍ය තරගාවලියේ ජ්‍යේෂ්ඨ අංශයේ දෙවන ස්ථානය දිනාගත් කෙටි කතාව**

සුපුරුදු ලෙසම තේෂ් උදෑසන ඇස් පිල්ලමින් දෑස් විවර කළේ හිරු අවදිව පැයකටත් පමණ පසුවය. මොහු නමින් තේෂ් අනුරංග විය. දඩබ්බර ගති පැවතුම් ගත පුරා දැවටුණු ඔහුට අවශ්‍ය ධනය, බලය හිමි වුණේ උපතින්ම ය. සියල්ලට සරිලන කඩවසම් පෙනුම ද දශමයකුදු අඩුවකින් තොරව හිමි වී තිබුණි.

අවුරුදු විස්සක් වුණු ඔහු පවුලේ එකම දරුවා ය. මේ උදෑසනම නෑමෙන් සීතල ජලයෙන් ගතට මෙන්ම සිතට ද නැවුම් බවක් ලැබෙන බව ඔහු අත්දැකීමෙන් දනියි. කළු ඩෙනිම් කලිසමට ගැළපෙන සුදු පැහැ ටී ෂර්ටයෙන් සැරසුණු ඔහුගෙන් දිස් වුණේ අමුතුම තේජාන්විත බවකි.

"අම්මා..."

"ඔව් සුදූ... ආ... මේ උදේ පාන්දර කොහේ යන්නද?"

"අද ක්ලාස් එකේ ආදි ශිෂ්‍ය රැස්වීමනෙ අම්මෙ."

"හා සුදූ, පරිස්සමට ගිහිං එන්න. කීයටද එන්නෙ?" ජයන්ති ඇසුවේ තම පුතාගේ සුන්දරත්වය නෙත් පුරා විඳගනිමින් ය.

"එනකොට හතර පහවත් වෙයි අම්මා."

"කාර් එක ඉස්සරහ පාක් එකේ. ඉන්න මං කී එක ගේන්නං."

"හරි අම්මා."

මව පිටව ගිය පසු ඔහු විසිල් නාදයක් නඟමින් කාමරයෙන් පිටවුණේ සුවඳ විලවුන් සුවඳ කාමරයේ දසත විසිරෙද්දී ය. දොර ළඟ සිටි තම මවට දණ ගසා වඳිද්දී ජයන්ති ආඩම්බරයෙන් තම පුතුගේ කම්මුලක් සිපගත්තාය.

පන්තිය ළඟට යනවිටත් එක පොදියට ළමයි එක්රැස්ව සිටියහ. රැස්වීමෙන් පසුව ඔවුහු ආපන ශාලාව වෙත ගියහ. ඒ අතර ඉනායා තම යෙහෙළියන් සමග කිචි බිචි ගා සිනාසුණාය. යෙහෙළියන් ආහාර ඇණවුම් කරන තුරු ඇය පසෙක රැඳී සිටියේ ළමයින් අතර තෙරපෙන්නට නොහැකි නිසා ය.

තේෂ් පසෙක වාඩි වී ආහාර ගනිමින් සිටියදී බාගෙට බැඳ තිබූ බිත්ති භාගයෙන් දුටුවේ ළා රෝස පැහැයෙන් වර්ණ රටා ඇඳ තිබූ අලංකාර නිය පෙළක් ප්‍රමාණයට කපා කළු පැහැ සිහින් පටි සහිත කුඩා මලකින් පමණක් හැඩ කර තිබූ පාවහන් පැළඳි යුවතියකගේ දෙපා ය. තේෂ්ට යුවතියගේ මුහුණ දැකගැනීමට නොහැකි වූයේ ඇය වේගයෙන් ආපන ශාලවෙන් පිටව යාමට පියවර තැබූ නිසා ය. තේෂ් වේගයෙන් දිව ගියේ ඇය සොයා ය. අනතුරුව ඇය බස් නැවතුමට දිව එනවිටම බසය පිටව





32 පිටුවට

ගියේය. මැළවුණු මුහුණින් ඉනායා නුග ගස් සෙවණ යටට වී සිටියාය.

බසයේ රියදුරුට දොස් නඟන යුවතිය දුටු විටදී තේෂ්ගේ මුහුණේ හසරැල්ලක් ඇඳුණේය. ඇයගේ සමීපයට පැමිණි තේෂ් ඇය දෙස බලා සිනාසුණාය. ඇයගේ සිතට චකිතයක් දැනුණේ සැන්දෑ ගොම්මන් කළුවර ප්‍රදේශය පුරා පැතිරෙමින් තිබූ නිසාය. එක් අතකට පාරේ එකදු මිනිසකු හෝ අසළ නොසිටි නිසාය.

"නංගී..."

"ඇයි?"ඇය බිම බලාගෙනම පිළිතුරු දුන්නාය.

"බස් එක මිස් වුණා නේද?"



"හ්ම් ඔව්."

"කොහෙටද යන්නෙ?"

"මාලිගාව පැත්තට."

"හ්ම්." ඇයට ඔහු පිළිබඳ සියුම් විශ්වාසයක් ගොඩනැගුණි.

"අයියා කොහේටද යන්නෙ?" තේෂ්ට කටඋත්තර නැති විය. ඇය තමාගේ පස්සෙන් ආවායැයි කියන්නටද නොහැකිය.

"න්නෑ මං... මං මේ යාළුවෙක්ව ගන්න ආවෙ." ඔහු තතනමින් මුවින් පිළිතුරක් පිට කළේය. ඈතින් බසයක් පැමිණියේ දෙදෙනාගේම අවධානය ඒ දෙසට යොමු කරමින්ය.

"මං යනව" ඇය කීවාය.

"නම මොකද්ද?" ඔහු ඇසුවේ සිතේ අමුතුම හැඟුම් පොදියක් පුරවාගෙනය.

"ඉනායා."

"හ්ම්, ලස්සනයි."

"ඔයා?"

"තේෂ්."

ඉනායා හිස ඔසවා බැලුවේ එවිටය. ඇස් කෙවෙණි අග තාලයට රඟන කෙස් රොදෙන් වැසුණේ සිහින ළපටි ඇස් මත අමුතු කතාවක් ලියන්නට සැරසෙන්නාක් මෙනි. සිහින්ව දිගටිව රටාවකට කපා තිබුණු ඇහිබැමේත් රෝස පැහැති තොල් පටවලත් සුන්දරත්වය ඔහු ඇයට සමීපව විඳ ගත්තේය. ළඟ ළඟම ආ බසයට නැඟුණු ඉනායා අසුනක වාඩි වූවාය.

නමින් ඉනායා දිව්‍යංශී නම් වූ මැය අහිංසක රූමත්, දහඅට වියැති යුවතියකි. පවුලේ දෙවැනි දරුවා වූ ඇය නිදහස් කිරිල්ලියක්ම වූවාය. නුවර වැව රවුම පසු කරන විටම බස් නැවතුමේදී මුණැගැසුණු තරුණයා තමා අසල ය. අතේ ගුලි කරගෙන හුන් කුඩා කොළයක් ඇයගේ අතේ මිට මෙළවූ ඔහු බසයෙන් බැස්සේය. ඇයගේ දෙතොලේ මඳහසක් නැඟුණේ එහි වූ අංක පේළිය දුටු විටය. ගෙදර ගොස් වතුර මල යට පැයක් පමණ ගත කළ ඇය දවසේ සිදුවූ සියල්ල සිහි කළේ අමුතුම මිහිරියාවකින් සිත පුරවාගෙනය. දුරකථන අංකයට ඇමතුමක් ගන්නවාදැයි සිතූ ඇය රාත්‍රී අටට පමණ ඇමතුම ගත්තාය.

"හෙලෝව්."

"කවුද මේ?"

"මං ඉනායා."

"ආ ඔයාද?"

"හ්ම්."

"හෙටත් ක්ලාස්ද?"

"ඔව්."

බොහෝ දෑ කතා කළ ඔවුන් කෙටි කාලයක් තුළදී වඩාත් සමීප වූහ. මාසයකට පසුව දිනක් උදෑසන ඉනායා යෙහෙළියන් සමග පන්තියට පියමනිද්දී තේෂ් සහ ඔවුන්ගේ යහළුවන්ද පසුපසින් ආවෝය. තේෂ්, ඉනායා ඉදිරියට විත් යෙහෙළියන් දෙස බැලුවේය. එය තේරුම් ගත් ඔවුහු ඇයව තනි කොට අත වනා උපහාසාත්මක සිනහවක් පා යන්නට ගියහ.

ඇය ඉදිරියට විත් ආයාචනාත්මක බැල්මක් හෙළූ තේෂ් "මං ඔයාට ආදරෙයි." කීවේය. ඉනායාගේ මුහුණ මත මල් උයනක සිරිය රැඳි සිනහවක් ඇඳුණේය. ඉනායා කිසිවක් නොකියා තේෂ්ගේ අතකින් අල්ලා ගත්තාය.

සැන්දෑ රත් පැහැ වළා තීරය සෙමෙන් අහසේ රටා වියද්දී තේෂ් සහ ඉනායා නුවර වැවේ රවුම් බංකුව මත හිඳ සිටියහ. හමනා සුළඟ දෙදෙනාව සිපගත්තේ සෙංකඩගල ප්‍රේමණීයම නගරය ලෙස ඔවුන්ට හැඟී යන විටය.

"තේෂ්..."

"මං ආදරෙයි."

"මාත් ආදරෙයි ඉනායා."

එක වරම ඉනායාට ඇති වූ කැස්ස සමග ලේ අහුරක්ම බිමට වැටුණේය. ඇය සිහිසුන්ව තේජ්ගේ පපුව මතට කඩාවැටුණාය.

"ඉනායා, අනේ නැගිටින්නකෝ." පපුව විදුලි වේගයෙන් ගැස්සෙමින් මෝටර් රථය වෙත ගිය තේජ් ඉනායා රැගෙන සැණෙකින් පේරාදෙණිය රෝහලට ගියේය. දැඩි සත්කාර ඒකකයට ඇතුළු කෙරුණු ඉනායාට ප්‍රතිකාර කළේ වෛද්‍ය නිසංක සූරියාරච්චිය. ඒ, තේජ්ගේ හොඳම යහළුවෙකි.

වෛද්‍යවරයා දැඩි සත්කාර ඒකකයෙන් පිටතට පැමිණෙන විටම කඳුළු පිරි දෙනෙත් පිස දමමින් තේජ් ඔහු වෙත ගියේය.

"මචං, මගේ කෙල්ලට කොහොමද බං?"

"කලබල වෙන්න එපා තේජ්. මගේ කාමරයට යමු."

තේජ් විගස යහළුවන් අමතා ඉනායාගේ මව ද කැටුව පේරාදෙණිය රෝහලට පැමිණෙන මෙන් දන්වා සිටිමින් වෛද්‍යවරයා පසුපසින් ගියේ අධිවේගයෙන් ගැහෙන හදවතිනි.

"මේකයි තේජ්, කලබල නොවී අහපං. කෙල්ලට තියෙන්නෙ කැන්සර් එකක්. හැදිල තියෙන්නෙ මීට අවුරුද්දකට විතර කලින් ඉඳං. එයාට තව ජීවත් වෙන්න තියෙන්නෙ පැය තුනයි. ඒ නිසා ළඟින්ම හිටපං."

නිසංක, තේජ්ගේ පිටට තට්ටු කර කාමරයෙන් පිටව ගියේය. තේජ්ගේ මුළු ලෝකයම සිය හිස මත කඩාවැටුණාක් මෙන් ඔහුට දැනුණේය. දෙරටුවෙන් පිටවීමට පැමිණි තේජ් දුටුවේ එම කතාව අසා සිටි ඉනායාගේ මව විලාප තබමින් සිටින අයුරුය. අනතුරුව ඉනායා අසලට ගිය මව දියණිය වැළඳගෙන බොහෝ වේලාවක් හඬා වැළපුණාය.

තේජ් ඇය අසලට ගොස් හිස අතගෑවේ සෙනෙහෙබර පියකු මෙනි.

"තේජ්... මට යන්න වුණොත්... පරිස්සමින් ඉන්න."

"මැණික මාව දාලා යන්න එපා." ඇය තේජ්ගේ ළය මතම හිස තබාගෙන අවසන් සුසුම් වාතලයට එක් කළාය. ඇයගේ අවසන් කටයුතු තේජ්ගේ මැදිහත් වීමෙන් සිදුකෙරිණි.

මේ වියෝවෙන් දෙමාසයකට පමණ පසු තේජ් දළදා මාලිගාවට ගොස් දළදා සමිඳුන් වැඳ පුදාගත්තේය. ඉනායා නැතිව ඔහු වැව රවුමේ ඇවිද ගිය මුල්ම දිනය එය විය. මේ වැව රවුමේ ඇය හා ගෙවූ සොඳුරු අතීතය සිහිපත් වූ වැව හඬා වැටෙන්නාක් මෙන් ඔහුට දැනුණේය.

"ඔයා සංසාරය පුරාවටම මගේම පතිනිය වෙන්න ඕන. එහෙම වෙන්න ආයෙත් භවයක් එනතුරු විඳවන්නද මේ භවය පුරා?" තේජ්ට සිතුණේ එසේය.

**කෝට්ටේ මහජන පුස්තකාල සාමාජික දරු දැරියන් අතර පසුගිය වසරේ පැවති සාහිත්‍ය තරගාවලියේ තවත් ජයග්‍රාහී කෙටිකතාවක් ලබන කලාපයේ පළකෙරේ.**






# කලා කෙත

පාඨක ඔබගේ ප්‍රදේශයේ කලාව හා සම්බන්ධ තොරතුරු මේ පිටුවේ පලකිරීමට අප වෙත එවන්න

## අජිත්ට සම්මානයක්



**ප්‍රවීණ චිත්‍රපට විචාරකයෙකු, සිනමා ලේඛකයකු හා නිර්මාණ රචකයකු වන අජිත් ගලප්පත්ති මහතා පසුගියදා සම්මානයට පාත්‍රවිය.**

ඉකුත්දා පැවැති **"effle"** සම්මාන උළෙලේදී ඔහු විසින් නිර්මාණය කරන ලද ''පුරුද්දට හුරුවෙමු'' නිර්මාණාත්මක අදහස වෙනුවෙන් මෙ-සේ විශේෂ සම්මානයක් ඔහුට හිමිවිය.

දැන්වීම් නිර්මාණයේ දීර්ඝ කාලීන අත්දැකීම් ඇති අජිත්, මෙරට ප්‍රමුඛ දැන්වීම් ප්‍රචාරක ආයතන කිහිපයකම නිර්මාණ රචකයකු ලෙස සේවය කර ඇත. දැනට ඔහු ඔගිල්වි ජියෝමෙට්‍රි ආයතනයේ සහකාර නිර්මාණ අධ්‍යක්ෂවරයා ලෙස සේවය කරයි.

## "වීර්යා" 5 වනදා සිට දිවයින පුරා



සැපට දුකට සනී, ක්ලීන් අවුට් වැනි චිත්‍රපට සිනමාවට දායාද කළ සුනිල් අරුණ වීරසිරිගේ සිව්වන සිනමා නිර්මාණය ''වීර්යා'' 2024 ජනවාරි 5 වැනිදා සිට දිවයින පුරා සිනමාහල්වල තිරගත විය.

සිංහල සිනමාවේ දැවැන්තම හා ජනප්‍රියම නළු නිළි එකතුවක රංගන දායකත්වයෙන් හැඩවුණු මේ අර්ථවත් විනෝදාත්මක චිත්‍රපටයේ ධාවන කාලය පුරා පැය දෙකක් පමණ වේ. ලකී ඩයස්, ශ්‍රියානි අමරසේන, රම්‍යා වනිගසේකර, ජගත් චමිල, කුමාර තිරිමාදුර, සරත් කොතලාවල, ඥාණාංග ගුණවර්ධන, රොඩ්නි වර්ණකුළ, නිරෝෂන් විජේසිංහ, දුලිකා මාරපන, සරණපාල ජයසූරිය, අංජුලා රාජපක්ෂ, සුජානි මේනකා, මිහිර සිරිතිලක, නෝමන් පලිහවඩන, නෙතු ප්‍රියංගිකා, ඇන්ටන් ජූඩ් මෙහි රඟපාති. ඇන්ටන් ජූඩ් රංගයෙන් දායක වූ අවසන් චිත්‍රපටය මෙය වේ.

ප්‍රමෝද් නයන වීරසිරිගේ සංගීතයට කුමාර තිරිමාදුර මුල් වරට චිත්‍රපට පසුබිම් ගායනයෙන් දායක වේ. තිර රචනය ලාල් පාගොඩ ආරච්චිගෙනි. මෙහි කැමරාකරණය පුෂ්පකුමාර බණ්ඩාර රාජගුරුගෙනි.



35 පිටුවට

## නොමියෙන මතක එක්කොට ඔවුන් නික්ම ගියහ




**ශ්‍රී ලංකේය කලා කෙත සුපෝෂණය කිරීම සඳහා විවිධ කලා ඉසව් ඔස්සේ සිය නිර්මාණ දායකත්වය දැක්වූ කලා ශිල්පීන් පිරිසක් පසුගිය දින කිහිපය තුළ අපට අහිමි විය.**

50 දශකයේ සිංහල සිනමාවේ අතිශය ජනප්‍රියත්වය පත් ප්‍රවීණ ජ්‍යෙෂ්ඨ රංගන ශිල්පිනි ලීනා ද සිල්වා මහත්මිය, ප්‍රවීණ සංගීත අධ්‍යක්‍ෂවරයෙකු හා සංගීත ගුරුවරයෙකු වූ ආනන්ද ගමගේ මහතා, වේදිකාව, සිනමාව, හා ටෙලි නාට්‍ය තුළ අමතක නොවන මතක සටහන් තැබූ ප්‍රවීණ රංගවේදී සුමින්ද සිරිසේන මහතා, ජ්‍යේෂ්ඨ රංගන ශිල්පී ලයනල් වික්‍රම මහතා, ශ්‍රී ලාංකේය කාටූන් කලාවට හා චිත්‍රකතාවට අප්‍රමාණ මෙහෙවරක් කළ ප්‍රවීණ කාටූන් ශිල්පී කැමිලස් පෙරේරා මහතා, ප්‍රවීණ කාටූන් ශිල්පි පර්සි මායාදුන්නේ මහතා, ජ්‍යේෂ්ඨ රංගන ශිල්පී රෙක්ස් කොඩිප්පිලි මහතා හා ABC මාධ්‍ය ජාලයේ හිරු FM නාලිකාවේ මාධ්‍යවේදී ඉසුරු ලකිතගේ නිශ්ශංක (ජ්‍යේෂ්ඨ මාධ්‍යවේදී නාරද නිශ්ශංකගේ පුත්) ඒ අතර වේ.

තමන් නියෝජනය කළ ඒ ඒ ක්ෂේත්‍රය වෙනුවෙන් දිවියම කැප කරමින් කලාවට කළ ඒ මහඟු මෙහෙවරට ඔවුන් වෙත 'ශ්‍රී පුර කලා කෙත' උපහාරය මෙසේ පුදකරමු.

## තත්පරයක් දෙන්න



ඒකාකාරී ටෙලිනාට්‍යවලින් හා මෙගා ටෙලිනාට්‍යවලින් හෙම්බත්ව සිටින වෙනසක් සොයන ප්‍රේක්ෂකයාට නවමු වින්දනයක් ගෙන දෙන අපූරු ටෙලි නාට්‍යයක් මේ දිනවල ස්වාධීන රූපවාහිනිය ඔස්සේ සති අන්ත දිනවල විකාශය වෙයි. ඒ සුපුන් රත්නායක අධ්‍යක්ෂණය කළ 'තත්පරයක් දෙන්න' ටෙලි නාට්‍යයයි.

රොජර් සෙනෙවිරත්න, තරින්දි ප්‍රනාන්දු, ශලනි තාරකා, වොල්ගා කල්පනී, සේමිණී ඉද්දමල්ගොඩ, දමිතා අබේරත්න, උපේක්ෂා ස්වර්ණමාලී ඇතුළු නළු නිළියන් රැසක් මෙහි රඟපාති.

පසුගිය කාලය තුළ ඉමහත් ප්‍රේක්ෂක ගෞරවයට පාත්‍ර වූ නව පරපුරේ නිළි තරින්දි ප්‍රනාන්දුගේ විශිෂ්ට රඟපෑම ටෙලිනාට්‍ය නරඹන කාගේත් විශේෂ කතාබහට ලක්ව ඇත.



## "රක්බ රක්බාන" ජාත්‍යන්තර සිනමා සම්මානයකින් පිදුම් ලබයි.

කැළණිය විශ්වවිද්‍යාලයේ සිනමා සහ රූපවාහිනී අධ්‍යයන අංශයේ ඉගෙනුම ලැබූ සංඛ රණවීර විසින් අධ්‍යක්‍ෂණය කළ ''රක්බ රක්බාන'' වාර්තාමය කෙටි චිත්‍රපටය සඳහා රුසියාවේ පැවැත්වුණු "La Boheme Cimema Festival 2023" සම්මාන උළෙලේදී ජූරි සම්මානයක් හිමි විය.

ලංකාවේ පාරම්පරික සටන් ශිල්පය වන අංගම්පොර සටන් කලාව හා එහි නූතන ප්‍රවණතා පිළිබඳව කතාබහ කෙරෙන මෙම නිර්මාණයට හිමිව ඇත්තේ 'සම්ප්‍රදායික වටිනාකම් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම' සඳහා වූ ජූරියේ විශේෂ සම්මානයයි.






## කුඩා ඉරි කැබැල්ලකින් විශාල අරුතක් දුන්

# කැමිලස්

කාටුන් ශිල්පියාට දේශපාලන පක්ෂ භේදයක් හෝ ආගම් භේදයක් නොතිබිය යුතුයි. ඔහු රටේ දේශපාලනය, ආර්ථිකය හා සංස්කෘතිය විනිවිද දකින්නෙකු මෙන්ම රෝගාතුරව, කුණු ගඳ ගසන රටක සමාජ දේහය සුවපත් කිරීම සඳහා මජර දේශපාලනඥයන්, සමාජ දූෂිතයන්, වංචනිකයන්, කුහකයන්, ගැන පමණක් නොව ඔවුන්ගේ විෂමාචාරයන්ද ජනතාවට හෙළි කරන්නෙකු විය යුතුයි. ඒ සඳහා කාටුන් ශිල්පියාගේ තෙලිතුඩ මත තැවරෙන තීන්ත බිඳකින් ඇඳෙන එක් ඉරි පහරක් පමණක් වුවද ප්‍රමාණවත් වනු ඇත.




ඉහත කී ගුණාංගයන් සපිරි, අඩ සියවසකට වැඩි කාලයක් තුළ ශ්‍රී ලාංකේය පුවත්පත් කලාව තුළ ආධිපත්‍යයක් පතුරුවා හරින ලද තවත් අභීත අදීන කාටුන් ශිල්පියෙක් පසුගියදා අපිට අහිමි විය. ඒ කැමිලස් පෙරේරා ය.

1939 දී දිනමිණ පුවත්පතේ පළවූ සයිමන් ජයසිංහ ගේ 'මුදලාලි' තීරු කාටුනයෙන් ආරම්භ වූ සිංහල තීරු කාටුන් කලාවේත්, 1947 ලංකාදීප පුවත්පතේ පළවූ ඔබ්රි කොලට්ගේ දේශපාලන කාටුනයත් සමගම බිහිවූ ශ්‍රී ලාංකේය දේශපාලන කාටුන් කලාවේත් සම්මිශ්‍රණයක් ලෙස කැමිලස්ගේ කාටුන් කලාව හැඳින්විය හැකිය. කොලට්ගෙන් පසුව බිහිවූ ජී. ඇස්. ප්‍රනාන්දු, ජෙප්රි යූනුස්, විජේසෝම, විනී හෙට්ටිගොඩ වැනි ශිල්පීන් විකට චිත්‍ර වෙත පමණක් යොමු වුවද කැමිලස් විකට චිත්‍ර මෙන්ම විකට තීරු චිත්‍රද ඔහුගේ නිර්මාණ සඳහා යොදාගත්තේය. සයිමන් ජයසිංහගේ මුදලාලි කාටුනයෙන් මුදලාලිට අමතරව මුදලාලිගේ හාමිනේ, පුතා ගුණපාල, දියණිය ගුණවතී, හපුයියා, බල්ලා වැනි උප ප්‍රධාන චරිත ජයප්‍රියත්වයට පත් කළා සේ කැමිලස් ද තමාගේ තීරු කාටුන් ඔස්සේ ඉමහත් ජනප්‍රියත්වට පත් උප චරිත රැසක් බිහිකළේය.

ව්‍යාපාරිකයෙකු ලෙස ද සාර්ථකත්වයට පත් කැමිලස් පෙරේරා ට පරම්පරාවෙන් උරුම දේපලක් නොවීය. ඔහුගේ උපන් ගම මීගමුව ය. පියා වූ තෝමස් පෙරේරා රජයේ සේවකයෙකි. මව මේබල් ප්‍රනාන්දු ය. ඇඳුම් මැසීම ඇයගේ ස්වයං රැකියාව විය. පියාගේ වැටුපත්, මව ඇඳුම් මැසීමෙන් ලබන ආදායමත් පවුලේ ජීවනෝපාය මාර්ග විය. සහෝදර සහෝදරියන් හතර දෙනෙකුගෙන් යුත් පවුලේ වැඩිමලා වූ කැමිලස් මූලික


37 පිටුවට

අධ්‍යාපනය ලද්දේ වැල්ල වීදියේ රෝමානු කතෝලික පාසලෙනි. උසස් අධ්‍යාපනය ලද්දේ මීගමුව මාරිස්ටෙලා සහ ශාන්ත මරියා යන විදුහල්වලිනි.

පාසල් වියේ සිටම චිත්‍ර ඇඳීමටත්, පාපන්දු ක්‍රීඩාවටත් හේ සමතකු විය. පසු කලෙක පාපන්දු ක්‍රීඩකයකු ලෙස මීගමුව ජුපිටර් ක්‍රීඩා සමාජයට ක්‍රීඩා කළ කැමිලස් පසුව එහි නායකත්වය ද දැරීය. කැමිලස්ගේ පාසලේ විදුහල්පතිවරයා මතට ලොල් වූවෙකු විය. දිනක් ඔහුගේ බීමත්ව සිටින කාටුන් චිත්‍රයක් කැමිලස් විසින් ඇඳ එය විදුහල්පතිවරයාට හසුවිය. ඔහු කැමිලස්ට තරවටු කර දඬුවම් කළේය. එහෙත් කෙන්තිය නිවුණු පසුව කැමිලස්ගේ හැකියාව වටහා ගත් විදුහල්පතිවරයා ඔහු ගෙන්වා පවසා ඇත්තේ 'උඹට ගැළපෙන රැකියාව චිත්‍ර කලාව' බවයි.

උසස් පෙළට පෙනී සිටින අවධියේම පවුලේ වැඩිමලා ලෙස තමන්ට ඇති වගකීම තේරුම් ගත් කැමිලස් රැකියා සිහිනය සැබෑ කරගැනීම සඳහා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අම්බන්මුල්ල මැටි කර්මාන්ත ශාලාවේ මැටි භාණ්ඩ තැනීම පිළිබඳ පුහුණුවක් ලැබීය.

උසස් පෙළ අවසන් වීමෙන් පසු රජයේ රැකියාවක් ලබා ගැනීමට ඔහුට හැකිවිය. මුලින්ම පුත්තලම කච්චේරියේ සේවය කළේය. පසුව කොළඹ කච්චේරියට මාරුවිය.

මේ කාලය තුළද කැමිලස්ගේ චිත්‍ර ඇඳීමේ ආශාව, ඇල්ම කිසිසේත්ම පහව නොගියේ ය. එවකට ජනප්‍රියම කාටුන් ශිල්පියා වූ ඔබ්රි කොලට්ගේ කාටුන්වලට කැමිලස් බොහෝ ප්‍රිය කළේය. ඔහු මීගමුවේ සිට කොළඹට සේවය සඳහා පැමිණියේත් ආපසු ගියේත් දුම්රියෙනි. දුම්රිය ගමන තුළ ඔහුට බොහෝ චරිත මුණ ගැසිණි. ලැබූ අත්දැකීම් ද බොහෝය. පසු කලෙක කාටුන් චරිත නිර්මාණයේදී සහ කාටුන්වලට අදහස් ලබාගැනීමේදී මේ මුණගැසුණු චරිත සහ අත්දැකීම් බෙහෙවින්ම ඉවහල් වන්නට ඇත. ගොඩ්ඩිංගේ චරිතයට බොහෝ හැඩරුව ඇති චරිතයක් තමාට දුම්රියේදී මුණ ගැසුණු බව වරක් ඔහු පවසා තිබිණි. කැමිලස්ගේ ජීවන ගමනේ සහකාරිය වූ කොන්සිලියා ප්‍රනාන්දු ඔහුට මුණ ගැසෙන්නේ ද මේ දුම්රිය ගමනේදී ය.

රැකියාවක් කළද තමාගේම කාටුන් චිත්‍රයක් පුවත්පතක පළ කර ගැනීමට ඔහු නොගත් උත්සාහයක් නොමැත. දිනක් මිතුරෙකුගේ මාර්ගයෙන් ප්‍රවීණ මාධ්‍යවේදී සුමනා සපරමාදු හඳුනාගත් කැමිලස් ඇගේ මාර්ග යෙන් 1964 දී තමාගේ ප්‍රථම කාටුනය සරසවිය පුවත්පතේ පළ කරවා ගත්තේය. ඉන් අනතුරුව රංජිත් විජයවර්ධන සහ එස්. සුභසිංහ මාර්ගයෙන් ලේක්හවුස් පුවත්පත්වල තවත් කාටුන් කිහිපයක් පළ කරවා ගත හැකි විය. එහෙත් ඔහු අඳින කාටුන් විශාල ප්‍රමාණයක් පළනොවීය. මේ ගැන කැමිලස් බෙහෙවින් කණස්සල්ලට පත්ව සිටියේය. මේ නිසාම ලේක් හවුස් ආයතනයේ ප්‍රකාශනයන්හි කාටුන් පළ කරගැනීමේ උත්සාහය අතැර ස්වාධීන ප්‍රවෘත්ති පත්‍ර ආයතනයට ගොස් ඩේවිඩ් කරුණාරත්නයන් මුණ ගැසිණි. කැමිලස්ගේ දක්ෂතාවය අවබෝධ කර ගත් කරුණාරත්න මහතා එවකට ජනප්‍රිය 'දවස' දිනපතා පුවත්පතේ කාටුන් පළ කිරීමේ අවස්ථාව ලබා දුන්නේය.1966 ජනවාරි 1 වැනි දින දවස පුවත්පතේ ඔහුගේ පළමු කාටුන් චරිතය වූ 'තෙපානිස්' පළ විය. කැමිලස් නාමය ජනතාව අතර යම් තරමකට ප්‍රචලිත කිරීමට 'තෙපානිස් ට හැකි විය.

තෙපානිස් කාටුනය ජනප්‍රියත්වයට පත්වෙද්දී ලේක්හවුස් බලධාරින්ගේ ඇස කැමිලස් දෙසට යොමු විය. කැමිලස්ගේද වඩා කැමත්ත තිබුණේ ලේක්හවුස් ආයතනයට ය. පියසේන නිශ්ශංකයන්ගේ කැඳවීමකින් ලේක්හවුස් ආයතනයට සම්බන්ධ වන කැමිලස් ජනතා පත්‍රයට දොං සේතං ඇන්දේය. තෙපානිස් කාටුනයට වඩා දොං සේතං අතිශය ජනප්‍රියත්වයට පත් විය. දොං සේතං කාටුනය තුළ ගොඩනැගුණු සෙසු චරිත වූ සිමෝනා, ලපයා, මෙරායා, ගොඩ්ඩිං අයියා ද පාඨකයන් ආදරයෙන් වැළඳ ගත්හ. ඒ සමගම කැමිලස් ලේක් හවුස් ප්‍රකාශනවලට නැතිවම බැරි කාටුන් ශිල්පියෙකු බවට පත් විය. සරසවිය පුවත්පතට දැක්කොත් පත්මාවතී, සන්ඩේ ඔබ්සවර් පත්‍රයට මිස්ට ලව්රිස්, මිහිර පත්‍රයට ටික්කා, සිළුමිණ පත්‍රයට සිරිබිරිස් සහ මෙහෙව් රටේ, ජනතා පත්‍රයට සෙල්ලං සේන යන කාටුන් ඇඳ දුන්නේය.



1974 අගෝස්තු 29 කැමිලස්ගේ කාටුන් දිවියේ තවත් අමතක නොවන දිනයකි. ඒ තමාගේ ප්‍රාණසම කාටුන් චරිතය වූ 'ගජමෑන්' ජන්මලාභය ලබා ශ්‍රී ලංකාවේ පළමු චිත්‍රකතා පත්තරය වූ 'සතුට' මංගල කලාපයේ පිටු අතරින් පාඨකයා හමුවට පැමිණි දිනයයි. මෙසේ ලේක් හවුස් ආයතනයේ සෑම ප්‍රකාශනයකම කැමිලස්ගේ කාටුන් ජනප්‍රියත්වයට පත්වෙද්දී 1974 දී ලේක් හවුස් පාලන අධිකාරිය විසින් ගත් තීරණයක්



38 පිටුවට




හේතුවෙන් එම ආයතනයේ ප්‍රකාශනවල කැමිලස්ගේ කාටුන් පළකිරීම අත්හිටුවන ලදී. මෙම තීරණය ඇතැම් අයෙකුට ප්‍රශ්නාර්ථයක් ගෙන දෙන්නක් වුවද කැමිලස් ගේ බොහෝ කාටුන්වල යටි අරුත අවබෝධ කරගෙන සිටි හා එවකට පැවති රජයේ මාධ්‍ය නිදහස ගැන හොඳින් දැන සිටි ලේක් හවුස් ප්‍රකාශන කියවූ බුද්ධිමත් පාඨකයාට නම් එය ප්‍රශ්නාර්ථයක් නොවීය. කැමිලස් යනු ජනතාවගේ පැත්තේ සිටගත් කාටුන් ශිල්පියෙකි. මා මේ ලිපියේ ආරම්භයේ සඳහන් කළ පරිදිම ඔහු සැබෑ කාටුන් ශිල්පියෙකි.

නොසිතූ මොහොතක ලේක්හවුසිය විසින් ගත් මේ තීරණය නිසා කැමිලස්ට දැඩි ආර්ථික අපහසුතාවලට මුහුණපාන්නට සිදුවිය. ඒ වන විටත් කැමිලස් එක් දරු පියෙකි.

මේ කාලය වන විට ශ්‍රී ලංකාවේ පැරණි පුවත්පත් ආයතනයක් වන ටයිම්ස් ආයතනය පාඩු ලැබීම නිසා විකුණා දමා තිබිණි. එසේ විකුණන ලද ටයිම්ස් ආයතනයේ කොටස් මිලදී ගෙන තිබුණේ අනුර බණ්ඩාරනායක හා බණ්ඩාරනායක පවුලේ සමීප හිතවතෙකු වූ හැරිස් හුළුගල්ලේ විසිනි. තමන්ගේ දේශපාලන ගමනට තල්ලුවක් ලෙස අලුත් පුවත්පතක් ආරම්භ කිරීමට අනුර බණ්ඩාරනායකට අවැසි විය. කර්තෘත්වය චින්තන ජයසේන ට පවරා තිබිණි. අනුර බණ්ඩාරනායක මහතාගේ කැඳවීමෙන් කැමිලස්ට ද මේ සඳහා සම්බන්ධ වීමට අවස්ථාව ලැබිණි. එහෙත් කැමිලස්ගේ එක් කොන්දේසියක් විය. ඒ කිසිවෙකුගේ දේශපාලන ඕනෑ එපාකම් මත කාටුන් ඇඳීමට බලපෑම් නොකළ යුතුය යන්න යි. පාලන අධිකාරිය මේ කොන්දේසියට එකඟ විය. එලෙස 'අද' පුවත්පතට සම්බන්ධ වන කැමිලස් දොං සේතං, මෙහෙව් රටේ සහ දැක්කොත් පත්මාවතී යන කාටුන් ඇන්දේය. චින්තන ජයසේනගේ සුපුරුදු සරල ලේඛන ශෛලියත්, කැමිලස්ගේ කාටුන් හේතුවෙන් 'අද' යම් තරමකට ජනප්‍රියත්වයට පත්වුවද විවිධ හේතූන් මත පුවත්පත නවතා දැමීමට පාලන අධිකාරිය තීරණය කොට තිබිණි.

ටයිම්ස් ආයතනයේ එක් කොටස් හිමියෙකු වූ හැරිස් හුළුගල්ල ට හා ඔහුගේ සොයුරු අර්ජුන හුළුගල්ල ට සම කොටස් අයිතිය හිමි මල්ටිෆැක්ස් ආයතනය මේ වන විටත් අලුත් වැඩකට අතගසා තිබිණි. ඒ ලංකාවේ දෙවන චිත්‍රකතා පත්‍රය බිහිකිරීමටය. එවකට ජනප්‍රියව තිබූ සතුට පත්‍රයට අභියෝග කළ හැකි චිත්‍රකතා පත්තරයක් නිකුත් කිරීමට ආයතනයට අවැසි විය. මෙම අභියෝගය භාර දුන්නේ 'අද' හිටපු කර්තෘ චින්තන ජයසේන හටය. චින්තන මේ කාර්යය සාර්ථක කර ගැනීම සඳහා කැමිලස් ට ආරාධනා කළේය. චින්තන හා කැමිලස් එක්ව සම්මුඛ පරීක්ෂණ පවත්වමින් පත්‍රය ජනප්‍රිය තලයට ගෙන යා හැකි දක්ෂතා සපිරි චිත්‍ර ශිල්පීන් පිරිසක් බඳවා ගත්හ.



39 පිටුවට




වෙනස්ම ප්‍රමාණයකින් හා ඔෆ්සෙට් මුද්‍රණයෙන් පත්‍රය නිකුත් කිරීමටත් ආකර්ෂණීය පෝස්ටරයක් මගින් දැවැන්ත ප්‍රචාරයක් ලබාදීමටත් පාලන අධිකාරිය හා එක්ව තීරණයක් ගෙන තිබිණි.

මේ අනුව 1975 ඔක්තෝබර් 20 වනදා 'සිත්තර' නමින් ලංකාවේ අතිශය ජනප්‍රියත්වයට පත් චිත්‍රකතා පත්තරය නිකුත් විය. කැමිලස් සිත්තර ට යළි 'ගජමෑන්' සහ 'සෙල්ලං සේන' ඇන්දේය. සතුට පුවත්පතට වඩා ගජමෑ-න් ජනතාව අතරට යන්නේ සිත්තර තුළිනි. ඊට හේතුව සිත්තර තුළ කැමිලස්ට තිබූ නිදහස් වාතාවරණයයි. මල්ටිෆැක්ස් ආයතනයේ සෙසු ප්‍රකාශන වූ 'සුහද' 'ස්-වර්ණ' 'සිත්සර' 'ඉරිදා' ඇතුළු පුවත්පත් රැසකටම ඔහු කාටූන් නිර්මාණය කළේය.

චින්තන ජයසේන මල්ටිෆැක්ස් ආයතනයෙන් ඉවත්වීමත් සමගම සිත්තර කර්තෘ ධුරයට පත්වූ කැමිලස් ආරම්භ-යෙන් වසර පහක් ඇවෑමෙන් සිත්තර ශ්‍රී ලංකාවේ විශාල අලෙවියක් සහිත ජනප්‍රියම චිත්‍රකතා පත්තරය බවට පත් කරන්නට සමත්විය. ඔහු සිත්තර මේ තත්ත්වයට ගෙන ආවේ සිත්තරෙහි සිටි ජනප්‍රියම චිත්‍රශිල්පියා වූ බලංගොඩ සරත්මධු මහතාද පත්තරයෙන් ඉවත්ව ගිය වාතාවරණයක් තුළ වීම විශේෂත්වයකි.

දසවසරකට වැඩි කාලයක් මල්ටිෆැක්ස් ආයතනයේ සේවය කළ කැමිලස් 1986 දී එයට සමුදෙන්-න් තමාගේම ප්‍රකාශන ආයතනයක් ආරම්භ කිරීමේ අදිටනිනි. එය සිතන තරම් පහසු වූයේ නැත. ප්‍රධානම අභියෝගය වූයේ පත්‍රය මුද්‍රණය කිරීමට තමන්ගේම කියා මුද්‍රණාලයක් නොතිබීමයි. මේ වන විටත් සිත්තරෙහි සිටි ජනප්‍රියම චිත්‍රශිල්පීන් සියලු දෙනාම පාහේ ඔහු හා එක්ව සිටියහ. මල්ෆැක්ස් ආයතනය තමන්ගේ දේශපාලන සම්බන්ධතා හා මුදල් බලය යොදවමින් කැමිලස්ගේ පත්තරය මුද්‍රණය නොකරන ලෙස මුද්‍රණාල හිමිකරු-වන්ට විවිධ බලපෑම් කරන්නට විය.

බැතිමත් කතෝලිකයෙකු වූ කැමිලස් තමන්ගේ ආගමික නායකයන් සමග පැවති සබඳතා නිසා බොරැල්ල මරදාන පාරේ ඥාණාර්ථ ප්‍රදීපය ගොඩනැගිල්ලේ පිහිටි කතෝලික මුද්‍රණාලය මගින් පත්තරය මුද්‍රණය කර ගැනීමටත්, කාර්යාලය සඳහා ඒ ගොඩනැගිල්ලේම ඉඩක් වෙන්කරවා ගැනීමටත් අවස්ථාව සැලසිණි. කෙසේ හෝ අභියෝග ජයගෙන කැමිලස් ප්‍රකාශන ආයතනයේ කුළුඳුල් ප්‍රකාශනය ලෙස 'ගජමෑන් සමග සත්සිරි' මෙලෙස බිහිවිය. එය සිත්තර තරමටම ජනප්‍රිය විය. කැමිලස් ආයතනයේ වෙළෙඳ ලාංඡනය ලෙස යොදා ගැනුනේ ගජමෑන්ගේ රුවයි.

ඉතා කෙටි කලකින් පත්තර ලෝකයේ දැවැන්තයෙකු ලෙස නැගී සිටින්නට ඔහුට හැකිවිය. දෙමටගොඩ ප්‍රදේශයෙන් ඉඩමක් මිලට ගත් කැමිලස් එම ස්ථානයේ තමන්ගේම මුද්‍රණායක් ඇරඹිය. කැමිලස් ප්‍රකාශන කාර්යාලයද මේ ස්ථානයේ පවත්වාගෙන ගියේය. සත්සිරි, රසික චිත්‍රකතා පත්තර සමග තවත් ප්‍රකාශන 12 ක් පමණ කැමිලස් ආයතනයෙන් නිකුත් විය. ඔහු ව්‍යාපාරික ලෝකයද ජයගත්තේය. එතෙක් මෙතෙක් ලංකාවේ බිහිවූ කිසිදු කාටූන් ශිල්පියකුට ඔහු තරම් සාර්ථක වීමට ඉඩ ලැබුණේ නැත.

කලක් අසනීපව සිටි ඔහු අවුරුදු අසූ හතරක දිවිගමන නිම කොට පසුගිය 17 වැනිදා අප අතරින් වෙන්ව ගියේය. එදිනම තමන්ගේ අවසන් කටයුතු සිදුකරන ලෙස ඔහු ඉල්ලා සිටින්නට ඇත්තේ තමන්ගේ කාටූන්වලින් මිනිසුන්ගේ මුවගට ඇති කළ සිනහව තමන් නිසාම දුකක් බවට පත්වෙන අයුරු බලන්නට ඇති අකමැත්ත නිසා වන්නට පුළුවනි.

නොමියෙන මිනිසුන් කිසිදා ලොව පහළ වන්නේ නැත.



39 වැනි පිටුවෙන්...

එහෙත් කිසිදා නොමියෙන නිර්මාණ දායාද කරන්නට ලොව පහළ වන මිලියන සංඛ්‍යාත මිනිසුන් අතරින් අතලොස්සකට හැකිව තිබේ. ලෝක සිතියමේ පුංචි තිතක් බඳු මේ දිවයිනේ උපන් කැමිලස්ද එවන් අයෙකි.

ඔහුගේ තෙලිතුඩින් නිර්මාණය වුණු චරිත කිසිදා මෙරට ජන හදවත් තුළින් මිය නොයනු ඇත. තෙපානිස්, දොංසේතං, සිරිබිරිස්, ගජමෑන්, පත්මාවතී, සෙල්ලං සේන, ලපයා, සිමෝනා මෙරායා, ටික්කා, පැටෝ, චූටි වැනි චරිත දෙස බලා අපිට සැමදා සිනාසිය හැකිය.

දූෂිත දේශපාලකයා ගැන කතා කරන හැම මොහොතකම මගෝඩිස්තුමා යන නාමය අපේ මුවගට නැගෙන සරදම් සිනහවක් සහිතව මතකයට නැගෙනු ඇත. ඔබේ තෙලිතුඩේ රැඳී තිබුණු ප්‍රබලත්වය එයයි..

අපිට ඉතිරි කර ගිය හැම චරිම ඔබට බොහොමත් ම ස්තූතියි.

**රංජිත් පුෂ්පකුමාර**

ශ්‍රී පුර

සාඩම්බර අගනගරයක ජනතා ආමන්ත්‍රණය

# පාඨක අදහස්



දේශමාන්‍ය හා කලාභූෂණ සම්මානයන්ගෙන් පුද ලද
ගුවන් විදුලි හා රූපවාහිනී ජ්‍යේෂ්ඨ මාධ්‍යවේදිනී
**තිලකා රණසිංහ**
(පිටකෝට්ටේ)

සුලබව දක්නට ලැබෙන විවිධ සඟරා අතරින් 'ශ්‍රී පුර' සඟරාව විශේෂත්වයක් පෙන්නුම් කරන්නට සමත්ව ඇති බව පැහැදිළි ය. යුගයේ අවශ්‍යතාවන්ට සරිලන පරිදි පෙර සහ පසු පරම්පරාවන්ට ප්‍රයෝජවත් වන ආකාරයෙන් මෙම සඟරාව නිර්මාණය කිරීම සම්බන්ධව කලා ලැදි, කලා හිතකාමී ප්‍රධාන සංස්කාරක නඳුන් මහතා ප්‍රමුඛ කර්තෘ මණ්ඩලයට මාගේ අවංක ස්තුතිය පුදකර සිටිමි.



**තිලකරත්න ගනෙහිආරච්චි**
පුවත්පත් ලේඛක
(කැස්බෑව)

කෙටි වුවත් ඉතා හරවත්, රසවත් ලිපි කියවීමෙන් මෙතෙක් මා නොදැන සිටි කරුණු රැසක් මේ සඟරාව කියවීමෙන් දැනගන්නට ලැබුණා. විශේෂයෙන් නිශ්ශංක අලගක්කෝනාර පිළිබඳවත් ඊ. ඩබ්ලිව්. පෙරේරා මහතා පිළිබඳවත් ලියා ඇති ලිපි ඉතාමත් වැදගත්. ඊ. ඩබ්ලිව්. පෙරේරා වැනි වීරෝදාර නායකයින් නූතන පරපුරේ දක්නට නොලැබීම ජාතියේ අවාසනාවක්.



**එම්. ඒ. ප්‍රියන්ති සේපාලිකා**
(රාජගිරිය)

කෝට්ටේ මහා නගර සභාවේ මාසික විද්‍යුත් ප්‍රකාශනය වන 'ශ්‍රී පුර' සඟරාව කියවූ පසු කෝට්ටේ පුරවැසියකු වීම පිළිබඳ දැඩි ආඩම්බරයක් සිතට දැනුණේ ය. කෝට්ටේ ඉතිහාසය පිළිබඳ වත් අතීත කෝට්ටේ රාජධානියේ ඉදිකිරීම් විශේෂයෙන් 6 වැනි පරාක්‍රමබාහු රජු ඉදිකළ කෝට්ටේ රාජ මහා විහාරය පිළිබඳවත් ඊ. ඩබ්ලිව් පෙරේරා මහතා පිළිබඳවත් කෝට්ටේ ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලය එතුමාගේ නිවහන බවත් දැනගත්තේ මේ සඟරාව කියවීමෙනි. එමෙන්ම කසළ කළමනාකරණය, වෛද්‍ය විද්‍යාත්මක කාරණා, නීතිමය කරුණු පිළිබඳ එකම සඟරාවකින් දැනගන්නට ලැබීම ඉමහත් සතුටට කරුණක් වශයෙන් සලකමි.



**ගිහාන් එල්. පී. ජයතුංග**
(මිරිහාන)

'ශ්‍රී පුර' මාසික විද්‍යුත් සඟරාව හුදෙක් පුවත්පතක් ඉක්මවා ගිය දැනුම් සම්භාරයක් ලෙසින් මම දකිමි. කෝට්ටේ පුරවරය පිළිබඳ ඉතිහාසගත කරුණු හා අනෙකුත් ඊටම සබැඳි වතගොතවලින් මෙම ප්‍රකාශය අපව මනාව පෝෂණය කරයි. මෙම කරුණු කාරණා එක්රැස් කර තබාගත් අයකුට එය ඉමහත් ප්‍රයෝජනවත් කෘතියක් වනු නොඅනුමාන ය. මෙය සෑම පුස්තකාලයකම පාසලකම තිබිය යුතු, මුද්‍රණය කර අළෙවි කිරීමට ඉදිරිපත් කළ යුතු සඟරාවකි.




කේසර විල

# ටීචර් මමයි සා. පෙළ අසමත් දරුවා

සැමටම කලින් හැම විට පාසල් ආවා
ඩෙස් පුටු හදා මුළු පන්තිය අතු ගෑවා
'බාබටන්' මිටක් ගුරු මේසයෙ තීවා
වේවැල දුටුව විට පොඩි බයකුත් ආවා

මාළු මිරිස් බටු පැළ ටික එක ලෙසම
සිටුවා දැමුවෙ මම වෙමි පන්තිය ළඟම
හවස් වරුවෙ පාසල් විත් හැම විටම
වතුර දමා හැදුවෙමි දරුවන් ලෙසම

තෙමෙනා පන්තිවල වහලෙට උළු දැමුවා
කැඩුණු ඩෙස් බංකු ඇණ ගසමින් හැදුවා
කොඩි ගහ උඩට නැඟ සතුටින් කොඩි දැමුවා
උදවු පදවු වාසිය නොබලම කෙරුවා



ක්‍රීඩා තරගවල මුලටම හිටියෙ මම
උණගස් කපා නිවාස හැඩ කළේ මම
පාඩම් මතක නැතුවට මට තැනක හැම
ඔසවා තැබුවෙ හැම විට විදු මවගෙ නම

පන්තියෙ පළවැනිය මට 'මැට්ටා' කීවා
කවුරුත් නැති තැනක උගෙ කන අතගෑවා
ඇත්ත නොදැන වරදම මගෙ පිට ආවා
වේවැල හඬා විත් අත්ලට සැර කීවා

පොතකට එහා ගොස් මම ලෝකය දුටුවා
හෙට දින අඳුරු නැත මම ඒ ගැන හිතුවා
නැතිමුත් 'ඒ' නවය මම කරම්ද මොනවා
ටීචර් මමයි 'සා පෙළ' අසමත් සිසුවා

මුහුණු පොතෙනි

# වැඩිහිටි නිවසක පෙරමග බලන අම්මා

ඇත තිතක් මා වෙත එන නුඹද මගේ පුතේ
වේගෙන් ඇවිදින් ගිය මග මතක් වීද පුතේ
නුඹ එනකං මග බලන්න පුරුදු කරපු නෙතේ
එදාට පසු නුඹෙ රූපය නෑ ඇඳුණේ පණේ

දහසක් බුදුවරු ඉපදුණ හිම්දිරියෙම උදේ
මහ සටනක් කරන්න අවි මුවත් කරනු දැනේ
රේස් දුවන ජීවිතයේ නිමක් නැතිද පුතේ
දිනූ පදක්කම් කොහි වෙද කියපං මට පුතේ


ඉර සේවෙත් ඉවර වෙලා ක්ෂිතිජ ඉරේ දැපේ
හා පැටියන් තුරුලු කරන් සඳ සාවිත් ඇඳේ
නුඹ තාමත් යුද පිටියේ සටන් වදිනු පෙනේ
සෙම්බුව පිඹිනා එකාට වෙඩි වැදිලද පුතේ

දුවල දුවල හති වැටුණම හැරිලා බලන් පුතේ
ආ මග සතුටක් තියේද හිතල බලන් පුතේ
ජීවිතයයි කියන දෙයත් තන අග පිනි ලෙසේ
වියැකී යන්නට පෙර එය රස විඳපන් පුතේ

ඇත පෙනුණ තිත තිතමයි ඒ නුඹ නම් නොවේ

සුජීව ඉන්ද්‍රික සිරිවර්ධන

# උදෑසනක අසිරිය



අතරින් පතරින් වැටෙනා හිරු රැස් කිරණා
ඇළ දොළවල් ගලා බසී කෙත් සරු කරනා
සීත සුළඟ ගතේ හැපී සෙමෙන් දැවටෙනා
වස්දඬුවේ ගීත ඇසෙයි සවන් පිනවනා

කුරුලු රංචු රෑන් රෑන් ඇත පියඹනා
ඕළු නෙළුම් සුවඳ දිදී දසත විහිදෙනා
ළමුන් පියනඟයි නියරේ පෙළින් පෙළීනා
සුන්දර ගැමි සිරියාවන් මෙලෙස දිස්වෙනා

එස්. ජී. චේතනා ධනංජනී

# ළමා පිටුව


## ඇයි..?

## අයිස් කැට දියවීම වැළැක්වීමට ලී කුඩු භාවිතා කරන්නේ ඇයි?

අයිස් දියවීමට තාපය අත්‍යවශ්‍ය වේ. ලී කුඩු තාප පරිවාරකයක් (තාපය ගමන් නොකරන ආවරණයක්) ලෙස ක්‍රියා කරයි. එහෙයින් අයිස් කැට දියවීමට අවශ්‍ය තාපය පිටතින් නොලැබේ. ඒ නිසා අයිස් දිය වන්නේ නැත.

## ලෝකේ වටේ



## චීනය

**මහජන චීන සමූහාණ්ඩුව ලෙසින් ද හඳුන්වයි. භූමි ප්‍රමාණය අතින් ලොව තුන්වැනි තැන චීනයට හිමි වේ. ලොව වැඩිම ජනගහණය වෙසෙන රට ය.**

අයත් වන මහාද්වීපය - ආසියාව

විශාලත්වය - වර්ග කිලෝමීටර 9, 596, 961

අගනුවර - බෙයිජිං

මුදල් ඒකකය - යුආන්

නිල භාෂාව - චීන මැන්ඩරින්

ප්‍රධාන අපනයන භාණ්ඩ - සේද, රෙදි පිළි, ලෝහ, තේ, ඛනිජ

ප්‍රධාන ආනයන භාණ්ඩ - වාහන, යන්ත්‍ර සූත්‍ර, රසායන ද්‍රව්‍ය

## සිඟිති සිත්තම්



චනුම් සෙතුම්සා දිසානායක
2 ශ්‍රේණිය
අනුලා විද්‍යාලය
නුගේගොඩ



ගගණ අනුහස් වෙත්තසිංහ
8 ශ්‍රේණිය
ශිෆීල්ඩ් ජාත්‍යන්තර පාසල

**මුද්දර එකතු කරමු**

# තැපැල් මුද්දරයේ පුරෝගාමියා වෙනුවෙන් අපෙන් උපහාරයක්




ලොව මුල්ම තැපැල් මුද්දරයේ නිර්මාතෘවරයා වූයේ ශ්‍රීමත් රෝලන්ඩ් හිල් ය. 1795 දෙසැම්බර් 03 වැනි දින බ්‍රිතාන්‍යයේ කීඩර් මිනිස්ටර් නම් ග්‍රාමයේදී ඔහුගේ උපත සිදුවිය.

1830 පමණ වන විට බ්‍රිතාන්‍යයේ තැපැල් කටයුතු තරමක අවුල්සහගත තත්ත්වයක පැවැතිණි. මේ තත්ත්වයට පිළියම් සෙවීමට හිල් නිරතුරුව මහන්සි ගත්තේය. එහි ප්‍රතිඵලයක් ලෙස තැපැල් සේවය සමාජයේ සෑම පුද්ගලයකුටම ප්‍රයෝජනවත් වන සේවාවක් බවට පත්විය. තැපැල් මුද්දරය පිළිබඳ යෝජනාව ඉදිරිපත් කිරීම මෙහි ප්‍රතිඵලයකි.

1837 දී බ්‍රිතාන්‍ය කිරුළ හිමි 4 වැනි ජෝර්ජ් රජුට මෙම යෝජනාව ඉදිරිපත් කළ හිල්, තැපැල් මුද්දරයේ නිර්මාතෘත්වය හිමිකර ගත්තේය. එතැන් පටන් බ්‍රිතාන්‍යයේ තැපැල් කටයුතු ක්‍රමවත් කිරීම උදෙසා කැප වූ හෙතෙම 1846 දී තැපැල් මගින් මුදල් යැවීමේ ක්‍රමය මනාව සංවිධානය කළේය.



තැපැල් මුද්දරයේ පුරෝගාමිත්වය උදෙසා 1868 දී හෙතෙම 'නයිට්' නාමයකින් ගෞරව ලැබී ය. එතැන් පටන් හෙතෙම 'ශ්‍රීමත් රෝලන්ඩ් හිල්' නම් විය. 1879 අගෝස්තු 27 වැනි දින ලන්ඩන් හි හැම්ස්ටඩ් හිදී ඔහුගේ අභාවය සිදුවිය. ඔහුගේ සේවයට ගරු කළ බ්‍රිතාන්‍ය රජය ලන්ඩන් හි වෙස්ට්මිනිස්ටර් ඇබේ දේවස්ථානයේදී අවසන් කටයුතු සිදුකළේ ය.

එම අභාවයෙන් වසර 100 ක් සපිරුණු දින එනම් 1979 අගෝස්තු 27 වැනි දින ශ්‍රීමත් රෝලන්ඩ් හිල්ගේ රුව රැගත් තැපැල් මුද්දරයක් ශ්‍රී ලංකා මුද්දර කාර්යංශය විසින් නිකුත් කෙරිණි. එහි වටිනාකම රුපියල් 3.00 කි.

---

**අපේ සිංහල පන්තිය**

## තනි පද

**වචන කිහිපයකින් කියවෙන අදහසක් එක් වචනයකින් දැක්වීම මෙහිදී සිදුකෙරේ.**

- අනුන්ට උදවු කිරීම - පරෝපකාරය
- අවුරුදු සියයක කාලය - ශත වර්ෂය, සියවස
- අසා සිටින්නා - ශ්‍රාවකයා
- අසු පිටින් ගමන් කරන්නා - අශ්වාරෝහකයා/ අසරුවා
- අහසේ හැසිරෙන - ආකාශචාරී
- ආහාර පාන ආදියෙන් වැළකී සිටින - උපවාසය
- ඇතාගේ නාදය - කුංචනාදය
- ඇතුන් රැක බලාගන්නා තැනැත්තා - අශ්වාරෝහකයා
- ඇඳුම් මසන තැනැත්තා - සන්නාලියා
- ඇස් දෙකම නොපෙනෙන - අන්ධ

## දෙසැම්බර් හා ජනවාරි මාසවල

## වැදගත් දින

**දෙසැම්බර් 05 - ජාතික ඩෙංගු මර්දන දිනය**
**දෙසැම්බර් 10 - ලෝක මානව අයිතිවාසිකම් දිනය**
**දෙසැම්බර් 11 - ලෝක ළමා සන්නිවේදන දිනය**

**ජනවාරි 01 - ලෝක සාම දිනය**
**ජනවාරි 02 - ලෝක බ්‍රේල් දිනය**
**ජනවාරි 15 - ලෝක ආගම් දිනය**
**ජනවාරි 26 - ජාත්‍යන්තර රේගු දිනය**

කතා කරන පින්තූර




# ගල් වූ නයගරාව

ඇමරිකා එක්සත් ජනපදයට සොබාදහම තිළිණ කළ සුන්දර දායාදයකි නයගරා දියඇල්ල. ලොව පළලින් වැඩිම දියඇල්ල ලෙසින් මෙය ලෝක වාර්තා පොතට ඇතුළත්ව තිබේ. මෙහි පළල අඩි 2500 ක්ද උස අඩි 170 ක්ද වේ. කැනඩාවේ ඔන්ටේරියෝ හා ඇමරිකාවේ නිව්යෝර්ක් නගරයන් මේ මනරම් දියඇල්ලෙන් වෙන් වේ. මේ දසුන් පෙළින් ඔබ දකිනුයේ ඇමරිකාවට උදාව ඇති ශීත ඍතුවේදී නයගරා දිය ඇල්ල හිම කැටි, හිම කුට්ටි බවට පත්ව මවන සොඳුරු දසුන ය.









තොරතුරු හා ඡායාරූප :

**අන්තර්ජාලය ඇසුරිනි**